## 2023 මාර්තු 13 වන දින
## බෙලිඅත්ත ප්‍රාදේශීය සභාවේ 2023 මාර්තු මාසයට
## අදාළව පැවැති හයවන මහා සභා වාරයේ
## 58 වන මහා සභා රැස්වීම් වාර්තාව.

**පැමිණීම**

01. ගරු සභාපති - සිරිල් මුණසිංහ මහතා
02. ගරු උප සභාපති - එම්.ජී.විරාජ් ලලන්ත ගලප්පත්ති මහතා
03. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.ජී.ජී.හෙලන් පුෂ්ප කුමාර මහතා
04. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - වී.පී.තිලක් කුමාර මහතා
05. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එන්.පී.ජී. පියරත්න මහතා
06. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - දයාරත්න ගුණවර්ධන මහතා
07. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - විදාන ආරච්චිගේ උදය කුමාර මහතා
08. .ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ප්‍රසාද් චින්තක රණමුක මහතා
09. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.ජී.ප්‍රභාත් චන්ද්‍ර කුමාර මහතා
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.පී.ශාන්ත මහතා
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එම්.පී.නිමල් ජයන්ත මුතුමාල මහතා
12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.කේ.අතුල සම්පත් මහතා
13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.අමල් ඉන්දික මහතා
14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - මයුර සිසිරනාත කොඩිතුවක්කු මහතා
15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එස්.ඩබ්.උදේශිකා හර්ෂනී මහත්මිය
16. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - බැදිගම පතිරණගේ ලසන්ත මහතා
17. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - බී. චමිල ප්‍රේමනාත් මහතා
18. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - මානවඩුගේ කැලුම් ජානක මහතා
19. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.ඒ.රසිකා වික්‍රමසිංහ මහත්මිය
20. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - මනෝජ් ලසන්ත විදානගම මහතා
21. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී -රෝහිනී බණ්ඩාර මහත්මිය
22. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.ඒ.ටී.සී.වෙදආරච්චි මහතා
23. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.ඒ. ශ්‍රියානි මහත්මිය

**නොපැමිණීම**

24. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එච්.ජී.දිනේෂ් අනුරුද්ධ මහතා
25. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එම්.එච්.රම්‍යාලතා ද සිල්වා මහතා
26. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ. දිල්ෂි රම්ෂිමා ගුණතිලක මහත්මිය

### 01. පිළිගැනීම..

2023 මාර්තු මාසයට අදාලව පවත්වනු ලබන මහා සභා රැස්වීමේ කටයුතු සාර්ථක කර ගැනීම සඳහා පැමිණ සිටින ගරු මන්ත්‍රීතුමන්ලා, ජනමාධ්‍යවේදීන් සහ බෙලිඅත්ත ප්‍රාදේශීය සභාවේ ලේකම් මහතා හා සහාය නිලධාරීන් ඇතුළු සියළු දෙනා ඉතා ගෞරවයෙන් පිළිගන්නා බව ප්‍රකාශ කරමින් ගරු සභාපතිතුමා සභාවේ කටයුතු ආරම්භ කළේය.

### 02. ආගම සිහි කිරීම සහ ජාතික ගීය ගායනා කිරීම

ගරු සභාපතිතුමා විසින් මහා සභා රැස්වීම සඳහා පැමිණ සිටින සියළු දෙනා අමතා ආගම සිහි කිරීමටත්, ජාතික ගීය ගායනා කිරීමටත් ජාතියට ගෞරව කිරීමටත් කර ආරාධනාව අනුව සියළුදෙනා එක්ව ආගම සිහි කිරීමෙන් අනතුරුව ජාතික ගීය ගායනා කර ජාතියට ගෞරව කරන ලදි.

### 03. පසුගිය සභා වාර්තාව සම්මත කිරීම ( සංශෝධනයන්ට යටත්ව)

2023 පෙබරවාරි මාසයට අදාළව, 2023 පෙබරවාරි 21 වන දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව නියමිත දිනයට ප්‍රථම ගරු උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රීතුමන්ලා වෙත ලැබීමට සලස්වා ඇති හෙයින්, එම වාර්තාව සභාව හමුවේ කියවූ වාර්තාවක් සේ සලකා සම්මත කළ යුතු බවත්, එම මහා සභා රැස්වීම් වාර්තාව සත්‍ය වාර්තාවක් ලෙස නිවැරදි කිරීම් හා සංශෝධනයන්ට යටත්ව පිළිගැනීම සුදුසු බවත් ගරු සභාපති සිරිල් මුණසිංහ මහතා යෝජනා කරන ලදි.

ගරු සභාපති සිරිල් මුණසිංහ මහතා විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බැදිගම පතිරණගේ ලසන්ත මහතා විසින් ස්ථිර කරන බව ප්‍රකාශ කරන ලදි.

ඉන් අනතුරුව ගරු සභාපති සිරිල් මුණසිංහ මහතා ප්‍රකාශ කරන ලද්දේ, පෙබරවාරි 21 දිනැති සභා වාර්තාවේ නිවැරදි කිරීම් හෝ විරෝධතාවයන් ඇත්නම් ඉදිරිපත් කිරීමට අවස්ථාව සැලසී ඇති බවයි.

**<u>නිවැරදි කිරීම් -</u>**

**04. <u>ගරු සභාපතිතුමා විසින් කරන ලද විශේෂ නිවේදන හා පසුගිය සභා වාර්තාවේ ප්‍රගතිය විමර්ශනය කිරීම.</u>**

**<u>ගරු සභාපති සිරිල් මුණසිංහ මහතා</u>**

අද දින ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ජී.දිනේෂ් අනුරුද්ධ මහතා සභාව නියෝජනය කිරීම සඳහා පැමිණීමට නොහැකි වූ බැවින් නිවාඩු අනුමත කර දෙන මෙන් ඉල්ලා ඒවා ඇති ලිපි පරිදි ඔවුන්ට නිවාඩු අනුමත කර ලබා දිය යුතු බව ගරු සභාපති සිරිල් මුණසිංහ මහතා යෝජනා කරන ලදුව එකී යෝජනාව සඳහා මහ සභාවේ අනුමැතිය ලද අතර අනතුරුව නිවාඩු අනුමත කරන ලදී.

**05. <u>ප්‍රාදේශීය සභාව අමතා එවා ඇති ලිපි, පෙත්සම්, සංදේශ, පැමිණිලි හා සන්නිවේදන</u>**

**<u>05(I). බෙලිඅත්ත ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ලේ වහලය මත සවි කරන ලද සෝලා පැනල පද්ධතිය වෙනුවෙන් 32% ක මිල වැඩිවීමක් සම්බන්ධයෙන්සෙල්ටෙක් ආයතනය ඉදිරිපත් කර ඇති ලිපිය</u>**

**<u>ගරු සභාපති සිරිල් මුණසිංහ මහතා</u>**

සෙල්ටෙක් ඉන්ටර්නැෂනල් ආයතනයේ කළමනාකරණ අධ්‍යක්ෂකවරයා විසින් බෙලිඅත්ත ප්‍රාදේශීය සභා කාර්යාල ගොඩනැගිල්ලේ වහලය මත සෝලා පැනල පද්ධතිය සවි කිරීම සම්බන්ධයෙන් ගරු ආණ්ඩුකාරතුමා වෙත යොමු කර ඇති ලිපියේ පිටපතක් ප්‍රාදේශීය සභාවට යොමු කර ඇත. එහි සඳහන් වන ආකාරයට ඔවුන් විසින් පවසා සිටින්නේ, ව්‍යාපෘතියේ වැඩ අවසන් කර ප්‍රාදේශීය සභාව දැනුවත් කර (2022/11/08) විදුලිබල මණ්ඩලයේ පරික්ෂා කිරීම මත සියල්ල නිම කර අදාළ ලිපිගොනු විදුලිබල මණ්ඩලය වෙත ඉදිරිපත් කර, මේ වනවිට අවසන් සම්බන්ධතාවය ලබා දීම සඳහා 32% ක මිල වැඩිවීමේ අනුමැතිය ලැබෙන තෙක් බලා සිටින බවයි.

ඒ අනුව වර්තමානයේ රටේ පවතින තත්වය හා නීතිමය පසුබිම සලකා බලා මේ පිළිබඳව සාධාරණ තීරණයක් ලබා දෙන ලෙසත්, අප වැඩ අවසන් කළ දින සිට මේ දක්වා මුදල් නොලැබීම මත අප වෙත සිදුවන පාඩුව ඉහත ඉල්ලීමට අමතරව පියවා ගැනීමට හැකි ආකාරය දන්වා සිටින ලෙසත්, අප හිතවත් ගරු ප්‍රාදේශීය සභාව ඉහත මුදල් ගෙවීමට හැකියාවක් නොමැති නම්, ඒ පිළිබඳව අප වෙත සිදුවන පාඩුව නොසලකා අපගේ සෝලා පද්ධතියට අයත් භාණ්ඩ ඉවත් කර ගැනීමට සිදුවන බවත් මේ සඳහා ඔබතුමාගේ කාරුණික උපදෙස් බලාපොරොත්තු වන බවත් මෙවැනි ලිපිය මගින් ඉදිරිපත් කර තිබේ.

මේ සම්බන්ධයෙන් 2023/03/01 දින පෙරවරු 10:30 ට පමණ අදාළ නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් රැස්වීමක් පවත්වන ලදී. එහි දී තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිලධාරීන් දෙදෙනකු ඒ සඳහා සහභාගී නොවූ නිසා නැවතත් 2023/3/10 දින රැස්වීමක් කැඳවූ අතර එහිදී අදාළ සියලු ලිපි ලේඛන තාක්ෂණික ඇගයීම් කමිටුව ඉදිරිපත් කළ අතර පසුව ඔහුන් විසින් පවසා සිටියේ, මෙම ලිපි ලේඛන පරිශීලනය කළ පසුව මේ සම්බන්ධයෙන් ගත හැකි උපදෙස් ලබා දෙන බවයි.

මෙම ව්‍යාපෘතිය සඳහා අපි සභාවේ තිබෙන මුදල් වැය කරන්නේ නැහැ. දේශීය ණය සංවර්ධන අරමුදලින් ණයක් ලබාගෙන මෙම ව්‍යාපෘතිය සඳහා යොදවා පසුව එය වාරික වශයෙන් තමයි අපිට ගෙවන්නට සිදු වන්නේ. මෙම සෝලා පැනල පද්ධතිය සවි කිරීම නිසා අපගේ විදුලි අවශ්‍යතාවය පිරිමැසෙන අතර සභාවට අමතර ආදායමක් ලැබෙනවා. සුනිත්‍ය බලශක්ති අධිකාරියේ ඉංජිනේරුවරයා පවසන ආකාරයට මෙම සමාගට 52% ක මිල වැඩිවීමක් ඉල්ලුම් කළ හැක. නමුත් මෙම කොන්ත්‍රාත්කාර සමාගම විසින් ඉල්ලා සිටින්නේ 32% ක මිල වැඩිවීමක් පමණයි.

මෙම සෝලා පද්ධතිය සවි කිරීමේ දී භාවිතා කල සියලුම උපකරණ ආනයනය කර ඇත්තේ කොරියාවෙන්ය. ලංකාවෙන් යොදා ගෙන ඇත්තේ කැලණි වයර් පමණි. එම නිසා මෙම සෝලා පද්ධතිය නියමිත ප්‍රමිතියට සකස් කර ඇති බවට අපට වගකීමක් ගන්න පුලුවන්. මම නම් පවසන්නේ, අදාල තාක්ෂණික කමිටුවේ නිළධාරීන්ගේ නිර්දේශයට අනුව මෙම මිල වැඩිවීම ගෙවීමට හැකිනම් එය ගෙවීමට සුදුසු බවයි.මේ පිළිබඳව ඔබතුමන්ලාගේ අදහස් දක්වන ලෙස මා මේ ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

පෙරවරු 10.32 ට පමණ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රෝහිනී බණ්ඩාර මහත්මිය සභා රැස්වීමෙන් පිටව යන ලදී.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මයුර සිසිරනාත කොඩිතුවක්කු මහතා</u>**

2021/02/24 දින සභාවේ දී, ප්‍රාදේශීය සභාව සඳහා සූර්ය කෝෂ සවි කිරීමට මිල ගණන් කැඳවීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත් කිරීමේ යෝජනාව ගෙන එන ලදී. ඒ අනුව මේ සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුව ලෙස නිලධාරින් හතර දෙනෙකු පත් කරන ලදී. නමුත් මෙම වාර්තාවේ සඳහන් වන ආකාරයට තාක්ෂණික ඇගයීම් කමිටුවේ සිටින්නේ නිලධාරීන් තිදෙනකු පමණයි. ඒ අනුව මෙම තොරතුරු වල පරස්පරතාවක් තිබෙන බවට අපට පෙනී යනවා. 2022/05/31 දින සභාවේ දී මෙම සමාගම විසින් මෙම කාර්යය ඉටු කිරීම සඳහා දින 60ක කාලයක් දීර්ඝ කර දෙන ලෙස හා දැනට මෙම ව්‍යාපෘතිය සඳහා ගිවිසුම් ගත මුදලට වඩා වැඩි පිරිවැයක් දැනට වැය වී ඇති නිසා ගිවිසුම්ගත මුදලට වඩා වැඩි ප්‍රතිශතයක් ලබා දෙන ලෙස ඉල්ලීම කර තිබුණි. නමුත් මෙම වැඩිවන ප්‍රතිශතයේ ප්‍රමාණය ගැන අපට සඳහනක් වී නොමැත.

එසේම මේ සම්බන්ධයෙන් පළාත් පාලන කොමසාරිස් වෙත ලිපියක් යොමු කර ඇති අතර එහි සඳහන් නිර්දේශ අනුව කටයුතු කරන බව එම සභා වාර්තාවේ සඳහන් වෙනවා. නමුත් මේ වන තෙක්ම එම නිර්දේශය මේ සභාවට ඉදිරිපත් වී නැහැ. එසේම මෙම 20% ක මිල වැඩිවීම, 12% ක මිල වැඩිවීම මේ සභාවට දැන ගැනීමට ඉදිරිපත් කර නැහැ. අවසානයේ 32% ක මිල වැඩිවීමක් තමයි මේ ඉල්ලා සිටින්නේ. එසේම මෙම රැස්වීමට සහභාගී වූ විගණන අධිකාරිවරයා විසින් පවසා සිටින්නේ, ප්‍රසම්පාදන නීතිරීති වල සඳහන් වන්නේ, මාස දෙකක කාල සීමාවක් සඳහා අදාල වන මිල විචලනයන් අදාළ නොවන බවත්, වසරකට වැඩි කාල සීමාවක් සඳහා වන කොන්ත්‍රාත් සඳහා මිලව විචලනයන් අදාළ වන බවත් එහි සඳහන් වේ. එසේ ම එම කොන්ත්‍රාත් සඳහා මිල විචලනයන් ඇතුළත් කිරීමට භාවිතා කරන සූත්‍රය කුමක්ද, ඒ සඳහා භාවිතා කරන ක්‍රමවේදය කුමක්ද යන්න පිළිබඳව මෙම ගිවිසුමේ ඇතුළත් විය යුතුය. නමුත් මෙම ගිවිසුමේ ඒ පිළිබඳව සටහනක් නොමැත.

ඒ අනුව විගණන අධිකාරියවරයා මේ සඳහා අනුමැතිය ලබා දී නැහැ. මොවුන් ඉල්ලා සිටින්නේ ලක්ෂ තිස් දෙකක පමණ මිල වැඩිවීමක්ය. මොවුන් විසින් අදාළ කාලසීමාව තුළදී මෙම කොන්ත්‍රාත්තුව නිමකල ප්‍රාදේශීය සභාවට භාර දුන්නේ නම් මෙම ගැටලුව මතුවන්නේ නැහැ. ඔවුන් අතින් සිදු වූ ප්‍රමාද දෝෂයක් හේතුව නිසයි මෙම මිල වැඩිවීම සිදු කිරීමට සිදුවී ඇත්තේ. එම නිසා මේ කරුණු පිළිබඳව සලකා බලා මේ සඳහා සුදුසු තීරණයක් ගන්නා ලෙස මම යෝජනා කරනවා.

**<u>ගරු සභාපති සිරිල් මුණසිංහ මහතා</u>**

මෙම කොන්ත්‍රාත්කරු විසින් කොන්ත්‍රාත්තුව භාර ගන්නා අවස්ථාවේ දීම 20% ක මිල වැඩි වීමක් ඉල්ලා තිබෙනවා. වර්තමානයේ පවතින මිල ගනන් සමඟ කෝටි දෙකකටවත් මෙම සෝලා පැනල පද්ධතිය සවි කිරීමට අපට හැකි වෙන්නේ නැහැ. මොවුන් විසින් මෙම සෝලා පැනල පද්ධතිය ගලවා ගෙන යන්නත් සූදානම්. තාක්ෂණික ඇගයීම් කමිටුවේ ඉංජිනේරු මහතා පවසන ආකාරයට 52% ක් දක්වා මිල වැඩිවීමකට යාමට ඔවුන්ට හැකියාව තිබෙනවා. නමුත් මෙම මිල වැඩිවීමට විගණන අධිකාරීවරයා හා ඉංජිනේරුවරයා අනුමැතිය ලබාදී නැහැ. එම නිසා නැවත සාකච්ඡාවක් කැඳවා මොවුන්ට මෙම තොරතුරු ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ඔවුන් විසින් මෙම සියලු ලිපි ලේඛන රැගෙන ගොස් එම තොරතුරු අධ්‍යයනය කිරීමෙන් පසු නිවැරදි තීරණයක් ලබා දෙන්නම් යැයි පැවසා සිටියා. එසේම ප්‍රසම්පාදන කමිටුවටද මෙහි වැඩි බලයක් තිබෙන බව ඔහු පවසා සිටියා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.පී.නිමල් ජයන්ත මුතුමාල මහතා</u>**

3/1 වන දින පවත්වන ලද කමිටු වාර්තාවට අනුව විගණන අධිකාරිය විසින් පවසා සිටින්නේ, ප්‍රසම්පාදන නීතිරීති වල සඳහන් වන්නේ, මාස දෙකක කාල සීමාවක් සඳහා අදාල වන කොන්ත්‍රාතු සඳහා මිල විචලනයන් අදාළ නොවන බවත්, වසරකට වැඩි කාල සීමාවක් සඳහා වන කොන්ත්‍රාත් සඳහා මිලව විචලනයන් අදාළ වන බවත් එහි සඳහන් වේ. එසේ ම එම කොන්ත්‍රාත් සඳහා අදාල මිල විචලනයන් ඇතුළත් කිරීමට භාවිතා කරන සූත්‍රය කුමක්ද, ඒ සඳහා භාවිතා කරන ක්‍රමවේදය කුමක්ද යන්න පිළිබඳව මෙම ගිවිසුමේ ඇතුළත් විය යුතුය. නමුත් මෙම ගිවිසුමේ ඒ පිළිබඳව සටහනක් නොමැත.

ඒ අනුව මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් අදාළ වන මූල්‍ය නිලධාරීන්ගේ නිර්දේශය අපට අවශ්‍ය වෙනවා. ඒ තීන්දුව අනුව තමයි අපට මෙහිදී තීරණයක් ගැනීමට හැකියාව තිබෙන්නේ. මේ නිලධාරීන් තමයි මෙහි ඇති සත්‍ය තත්ත්වය පිළිබඳව සත්‍ය වශයෙන් දන්නේ. එම නිසා මෙම නිලධාරීන්ට විසින් මේ සභාවේ සිටින සභිකයින්ට මේ පිළිබඳව පැහැදිලි කිරීමක් අවශ්‍ය වෙනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මයුර සිසිරනාත කොඩිතුවක්කු මහතා</u>**

මෙම ගැටලුවට අදාළව පවත්වන ලද රැස්වීමේදී පළාත් පාලන සහකාර කොමසාරිස්වරයා පවසා සිටින්නේ පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් පවසන ආකාරයට මෙම මිල වැඩි වීම අනුමත කළ යුත්තේ තාක්ෂණික කමිටුවේ නිර්දේශය මත බවයි. නමුත් මෙම තාක්ෂණික කමිටුවේ දෙදෙනකු මේ සඳහා කැමැත්ත ප්‍රකාශ කර නොමැති අතර ඔවුන් විසින් සටහනක් තබා ඇත්තේ මෙය මුදල් අමාත්‍යාංශයට යොමු කරන ලෙසයි. එසේම විගණන අධිකාරීවරයා මෙහිදී ප්‍රකාශ කර ඇත්තේ, ප්‍රසම්පාදන නීතිරීති වල සඳහන් වන්නේ, මාස දෙකක කාල සීමාවක් සඳහා අදාල වන මිල විචලනයන් අදාළ නොවන බවත්, වසරකට වැඩි කාල සීමාවක් සඳහා වන කොන්ත්‍රාත් සඳහා මිල විචලනයන් අදාළ වන බවත් එහි සඳහන් වේ. එසේ ම එම කොන්ත්‍රාත් සඳහා අදාල මිල විචලනයන් ඇතුළත් කිරීමට භාවිතා කරන සූත්‍රය කුමක්ද, ඒ සඳහා භාවිතා කරන ක්‍රමවේදය කුමක්ද යන්න පිළිබඳව මෙම ගිවිසුමේ ඇතුළත් විය යුතුය. නමුත් මෙම ගිවිසුමේ ඒ පිළිබඳව සටහනක් නොමැත.

ඒ අනුව ඔවුන් විසින් දක්වා ඇති අදහස් එකිනෙකට පරස්පරතාවයක් තිබෙනවා. එසේ තිබියදී අපට මේ සඳහා එකඟතාවය පළ කිරීමේ හැකියාවක් නැහැ. එසේම මෙම මිල වැඩිවීම සත්‍ය වශයෙන්ම 32% ක්ද, නැද්ද යන්න පිළිබඳව අපට පැහැදිලි කිරීමක් අවශ්‍ය වෙනවා.

**<u>ගරු සභාපති සිරිල් මුණසිංහ මහතා</u>**

පවතින නීතිරීතිවලට අනුව අපිට මෙය ලබා දිය හැකිනම් අපි මෙය ලබාදෙමු. මේ සමාගමට මෙය ගලවා ගෙන ගියහොත් විශාල ලාභයක් තිබෙනවා. අපි නැවතත් මෙවැනි සෝලා පද්ධතියක් සවි කිරීමට ගිය හොත් මීට වඩා විශාල මුදලක් වැය කිරීමට සිදුවෙනවා.

ඒ අනුව තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශය මත, ප්‍රසම්පාදන කමිටුවට මේ සඳහා 32% ක මිල වැඩිවීමක් ගෙවීම හැකියාව පවතීනම් ඒ සඳහා අනුමැතිය ලබාදීමට සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**<u>05(II). බෙලිඅත්ත ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ලේ අංක 01 කඩ කාමරයේ එක්වන් මුදල ගෙවීම සඳහා වසර දෙකක සහන කාලයක් ඉල්ලා එවා ඇති ලිපිය</u>**

**<u>ගරු සභාපති සිරිල් මුණසිංහ මහතා</u>**

බෙලිඅත්ත බස් නැවතුම්පොළ උඩුමහලේ අංක 01 කඩකාමරයේ බදුකරුවන ඒ.කේ. අමරසිංහ මහතා විසින් මේ සභාව සඳහා ලිපියක් යොමු කර ඇත. එහි සඳහන් වන්නේ ඔහු මුහුණදී ඇති ආර්ථික අපහසුතාවය හා ඔහුගේ සෞඛ්‍ය තත්ත්වයේ පවතින ගැටලු නිසා ඔහුට ගෙවීමට ඇති රුපියල් ලක්ෂ 5ක් වූ එක්වන් මුදල එකවර ගෙවීමට නොහැකි නිසා ඒ සඳහා වසර දෙකක සහන කාලසීමාවක් ලබා දෙන ලෙසයි. ඒ අනුව ඔහු විසින් සභාවට යොමු කර ඇති ලිපිය ගරු සභාපතිවරයා විසින් සභාවට ඉදිරිපත් කරන ලදී.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මයුර සිසිරනාත කොඩිතුවක්කු මහතා</u>**

කඩකාමර බදු දීමේ දී හා මෙවැනි පරිදි එක්වන් මුදල් අය කිරීමේ දී ඒ සඳහා බලපාන යම් යම් නීතිරීති හා රෙගුලාසි පවතිනවා ද යන්න පිළිබඳව පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් හෝ යම් චක්‍රලේඛයක් මගින් දැනුවත් කර ඇත්නම් ඒ පිළිබඳ මේ සභාව දැනුවත් කරන ලෙසයි මා ඉල්ලා සිටින්නේ.

**<u>ගරු සභාපති සිරිල් මුණසිංහ මහතා</u>**

නීති රීති හා රෙගුලාසිවලට අනුව නම් වසරක් ඇතුළත මෙම එක්වන් මුදල ගෙවිය යුතුයි. මෙය සභාවට ඉදිරිපත් කලේ ඔබතුමන්ලාගේ අදහස් විමසීම සඳහාය.මෙම ගොඩනැගිල්ල ඉදිකලේ ධීවර අමාත්‍යාංශය විසින්ය. මේ තුළින් අපට ආදායමක් ලැබෙනවා. මේ ගොඩනැගිල්ල තුල සැලූන් දහයකට ආසන්න ප්‍රමාණයක් තිබෙනවා. ඇතැම් විට මෙමා අංක එකේ කඩකාමරයේ සැලූන් එක සඳහා දිනකට පාරිභෝගිකයින් දහ දෙනෙකුවත් පැමිණෙනවාද යන්න පිළිබඳ අපට ගැටළුවක් තිබෙනවා. එම නිසා මේ පිළිබඳව අපි මානුෂිකව සිතා බලා මේ සඳහා ඔබතුමන්ලාගේ අදහස් දක්වන ලෙස මා ඉල්ලා සිටිනවා. අපි මහජන නියෝජිතයින් ලෙස මා යෝජනා කර සිටින්නේ මේ සඳහා වසරක දෙකක සහන කාලසීමාවක් ලබා දෙන ලෙසයි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.පී.නිමල් ජයන්ත මුතුමාල මහතා</u>**

කඩ කාමර බදු දීමේදී මුලසිටම නිවැරදි ක්‍රමවේදයක් භාවිතා කළේ නැහැ. මේ සඳහා මන්ත්‍රීවරුන් ලෙස අප සියලු දෙනා හා පළාත් පාලන දෙපාර්තමේන්තුවේ කොමසාරිස්තුමිය සිට සියලුම නිලධාරීන් මේ සඳහා වගකිව යුතුයි. සභාවේ කඩ කාමර බදු දීම වෙනුවෙන් මම නිරන්තරයෙන් අරගලයක් ක්‍රියාත්මක කලා.

කඩකාමර බදු හිමියන් විසින් මෙම එක්වන් මුදල් ගෙවිය යුත්තේ කඩකාමර බදු ගැනීමේදීමය. නමුත් තවමත් මොවුන් මෙම මුදල ගෙවා නැහැ. මොහු පමණක් නෙමෙයි තවත් විශාල කඩ කාමර හිමියන් ප්‍රමාණයක් මෙම එක්වන් මුදල නොගෙවා සිටින බව අප දන්නවා. මෙසේ එක් අයෙකුට මෙම සහනය ලබා දුන්නොත් අනිත් සියලු දෙනාම මෙය ඉල්ලුම් කිරීමට හැකියාව තිබෙනවා. ඒ නිසා මේ සියලු කඩ හිමියන්ට සාධාරණයක් ඉටු කළ යුතුයි.

**ගරු සභාපති සිරිල් මුණසිංහ මහතා**

ප්‍රාදේශීය සභාවේ කිසිම කඩකාමරයක් නීතියානුකූලව ලබා දීල නැහැ. මේ සැම කඩකාමරයක්ම එකිනෙකාගේ බලපෑම් ඉල්ලීම් මත ටෙන්ඩර් පටිපාටියකින් තොරව තමයි ලබා දී තිබෙන්නේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විදාන ආරච්චිගේ උදය කුමාර මහතා**

පෙර සභා වාරයේදී මා කුමාසිටි කම්පෙලෙක්ස් ආයතනයෙන්ද මෙවැනි ඉල්ලීමක් කළා. එහිදි මා ප්‍රකාශ කර සිටියේ මේ තුළින් සභාවට ලැබෙන ආදායම අඩු වීමක් සිදුවන බවයි.අදත් එක් අයෙකු ලිපියක් ඉදිරිපත් කර තිබෙනවා. පසුව මේ සියලු කඩ කාමර හිමියන් මෙසේ ඉල්ලීම් කළොත් අපි සිදු කරන්නේ කුමක් ද, අවසානයේ සිදුවන්නේ සභාවට ලැබෙන ආදායමක් අහිමි වීම පමණයි.

**ගරු සභාපති සිරිල් මුණසිංහ මහතා**

නමුත් අපි මෙහි දී මහජන නියෝජිතයින් ලෙස සිතා වැඩ කටයුතු සිදුකල යුතුයි. මොවුන් විසින් මෙවැනි ඉල්ලීමක් සිදු කිරීමට සාධාරණ හේතු තිබෙනවා. එම නිසා සියලු කඩහිමියන් පිළිබඳව සිතාබලා මා යෝජනා කරන්නේ මෙසේ එක්වන් මුදල් ගෙවීමට සිටින සියලු කඩහිමියන් විසින් එම එක්වන් මුදල සමාන වාරික 24 කින් ගෙවා නිම කරන ලෙසත්, එම වාරික මුදල මාසික බදු කුලිය ගෙවන දිනයේදීම ගෙවීමට සලසා දීම සුදුසු බව යෝජනා කරනවා.

ඒ අනුව, බෙලිඅත්ත ප්‍රාදේශීය සභාවේ කඩ කාමර සඳහා අයවිය යුතු එක්වන් මුදල සමාන වාරික 24 කින් ගෙවා නිම කරන ලෙසත්, එම වාරික මුදල මාසික බදු කුලිය ගෙවන දිනයේදීම ගෙවීමට සලසා දීම සුදුසු බවට වූ යෝජනාව විරෝධතාවයකින් තොරව ඒකමතිකව සභා සම්මත කරන ලදි.

## 05.(III) 2022.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා බෙලිඅත්ත ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශය

**ගරු සභාපති සිරිල් මුණසිංහ මහතා**

2022.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා බෙලිඅත්ත ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශය මා මේ ගරු සභාවට ඉදිරිපත් කරනවා.

## 06. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න - නැත.

## 07. යථා පරිදි කල්දි ඇති යෝජනා:-

## 07(I). බෙලිඅත්ත අම්පිටිය වැවෙහි ඇවිදින මංතීරුවට දුම්රියපොළ අසලින් පිවිසුම් මාර්ගයක් ස්ථාපිත කිරීම සඳහා අදාළ ඉඩම් කොටස හා බෙලිඅත්ත ලුණුකඩේ හන්දියේ රක්ෂණ සංස්ථාව සතු ඉඩම අත්පත් කර ගැනීම නාගරික සංවර්ධන අධිකාරිය මගින් සිදු කිරීම සඳහා ඊට අදාල වන මුදල නාගරික සංවර්ධන අධිකාරිය වෙත ගෙවීමේ යෝජනාව

යෝජනාකරු -: ගරු සභාපති සිරිල් මුණසිංහ මහතා

ගරු සභාපති සිරිල් මුණසිංහ මහතා විසින් ගෙන එන ලද එකී යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බැදිගම පතිරණගේ ලසන්ත මහතා විසින් ස්ථිර කරන ලදී.

**ගරු සභාපති සිරිල් මුණසිංහ මහතා**

දැනට මෙම මංතීරුව සකස් කරලා තිබෙනවා. එම මං තීරුවට පිවිසීමට දුම්රියපොළ අසලින් මීටර් 60 ක පමණ ඉඩම් කොටසක් තිබෙනවා. එම ඉඩම අත්පත් කරගතහොත් මෙම ඇවිදින මංතීරුව භාවිතා කිරීමට අපේක්ෂා කරන ජනතාවට එය ඉතාමත් පහසු වෙනවා. නාමල් නමැති පුද්ගලයාට තමයි මේ ඉඩමෙහි හිමිකාරීත්වය තිබෙන්නේ. ඔහු සමඟ පසුගිය දිනක මේ පිළිබඳව සාකච්ඡා කළා. ඔහු මෙම ඉඩම අත්පත්

කර ගැනීම සඳහා අනුකූලතාවයක් දැක්වූවා. මෙය ඉතාමත් කාලෝචිත ගැටලුවක්. මෙය අප විසින් අත්පත් කර ගැනීමේ කටයුතු කළහොත් ඒ සඳහා දීර්ඝ කාලයක් ගතවනවා. එබැවින් නාගරික සංවර්ධන අධිකාරිය හරහා මෙය අත්පත් කර ගැනීම සිදුකලහොත් ඉතාමත් අඩු කාලයකින් මෙය අත්පත් කර ගැනීම සිදු කිරීමට හැකියාව ලැබෙනවා. අප විසින් ඔවුන්ට මුදල් ලබා දී ඔවුන්ගේ නීතිරීති අණපනත් වලට අනුව මෙම ඉඩම අත්පත්කර ගැනීමට කටයුතු කරමු. ඒ වගේම රක්ෂණ සංස්ථාව සතු ඉඩමක් නාගරික සංවර්ධන අධිකාරිය හරහා අත්පත් කර ගැනීමේ කටයුතු කිරීම් තුළින් එම ඉඩමත් ඉතාමත් කෙටි කාලයක් තුළදී අත්පත් කර ගැනීමේ කටයුතු සිදු කිරීමට අපට හැකියාව ලැබෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී. චමිල ප්‍රේමනාත් මහතා**

මෙය ඉතාමත් කාලෝචිත යෝජනාවක්. දැනට මෙය වල් බිහි වී ගෙන යනවා. ඒ නිසා මෙම ඉඩම අත්පත් කර ගැනීමේ කටයුතු ඉක්මණින් සිදු කර පසුව මෙහි වැඩ කටයුතු අවසන් කර මෙම කටයුතු හැකි ඉකිමණින් නිමකරන ලෙසයි මා යෝජනා කරන්නේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ජී.ප්‍රභාත් චන්ද්‍ර කුමාර මහතා**

රක්ෂණ සංස්ථාව සතු ඉඩම අත්පත්කර ගැනීමේ දී එහි සිටින නිලධාරීන් හා සේවකයින් මෙය ප්‍රාදේශීය සභාව විසින් අත්පත් කර ගැනීමේ අරමුණ පිළිබඳව නිසි වැටහීමක් නැහැ. අපිත් නිරන්තරවම එම නිලධාරීන් සමඟ සම්බන්ධ වෙලා කටයුතු කරන නිසා ඔවුන් මේ පිළිබඳව අපෙන් විමසීම් සිදුකරනවා. ඒ නිසා ඒ නිලධාරීන් කැඳවලා ප්‍රාදේශීය සභාවට මෙම ඉඩම අත්පත් කර ගැනීමේ වැදගත්කම සහ අවශ්‍යතාවය පිළිබඳව ඔවුන් දැනුවත් කිරීමක් කරන ලෙස මා ඉල්ලා සිටිනවා. එසේම ඒ ඉඩම අත්පත් කර ගැනීම වෙනුවෙන් ඔවුන්ට ලබාදෙන ඉඩම පිළිබඳවත් ඔවුන් දැනුම්වත් කරන ලෙසයි මා ඉල්ලා සිටින්නේ.

**ගරු උප සභාපති එම්.ජී.විරාජ් ලලන්ත ගලප්පත්ති මහතා**

සභාවෙන් මෙම ඉඩම් කැබැල්ල අත්පත් කර ගැනීමේ කටයුතු ඉටු කිරීමට පෙර මේ ඉඩම බද්දට ගැනීම සඳහා මා සියලු කටයුතු සිදු කරමින් පැවතුනා. නමුත් ඒ සියලු කටයුතු එසේ සිදු කිරීමේ දී තිබියදී ප්‍රාදේශීය සභාව විසින් මෙය අත්පත් කරගැනීම සඳහා ඉල්ලුම් කළා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මයුර සිසිරනාත කොඩිතුවක්කු මහතා**

රක්ෂණ සංස්ථාව සතු ඉඩම අත්පත් කර ගැනීමේ කටයුතු කිරීමේ දී යම් යම් ගැටලුකාරී තත්ත්වයන් තිබෙනවා. රක්ෂණ සංස්ථාව සතු ඉඩමේ ඉදිකිරීම් සඳහා ඔවුන් විශාල කාලයක් බලා සිටියා. නමුත් ඒ සඳහා ප්‍රාදේශීය සභාවෙන් අනුමැතිය ලැබී නැති බවයි පෙනී යන්නේ. එසේම ප්‍රාදේශීය සභාවෙන් මෙසේ ඉඩම් අත්පත් කරගෙන ඒවාට සිදු කරන දේ පිළිබඳව පූර්වාදර්ශ පෙනෙන්නට තිබෙනවා. එම නිසා මෙම ඉඩම අත්පත් කරගෙන එයට කුමක් කරනවාද යන්න පිළිබඳව ඔවුන්ට ගැටලුවක් තිබෙනවා. මෙසේ ප්‍රාදේශීය සභාව සතු ඉඩම්වල ඉදිකිරීම් සිදුකර අවසානයේ එම ඉඩම් වල කඩ කාමර ආදිය බදු දී ඇත්තේ කෙසේද යන්න පිළිබඳව මේ ප්‍රදේශය ජනතාව අතර දැන් ප්‍රචලිත වෙලා තිබෙනවා.

මුල සිටම මාගේ අදහස් වූයේ ප්‍රාදේශීය සභාව හා රක්ෂණ සංස්ථාව යන දෙකම එකතු වී මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලෙසයි. රක්ෂණ සංස්ථාවට ඔවුන්ගේ වැඩ කටයුතු සිදු කිරීමට ස්ථානයක් නොමැති බව අපට පැහැදිලිව පෙනෙනවා. ඔවුනුත් මුල සිටම පැවසුවේ ඔවුන්ගේ වැඩ කටයුතු කිරීමට සුදුසු ස්ථානයක් ලබා දෙනවා නම්, ඔවුන් මෙම ඉඩම ප්‍රාදේශීය සභාවට ලබා දීමට කටයුතු කරන බවයි. මෙම ඉඩම අත්පත්කර ගැනීම අනාගතයේ අපේ දරු පරපුරට ඉතාමත් වටිනවා. නමුත් අපි හෙට මෙතනින් ගිය පසු මීළඟට බලයට පත්වන පාර්ශවය මෙම ඉඩමේ කුමන කටයුතු කරයිද යන්න පිළිබඳව අපට ගැටළුවක් තිබෙනවා. එම නිසා අපි එම වගකීම ගත යුතුයි. නාගරික සංවර්ධනය අධිකාරිය හරහා මෙම කටයුතු කිරීම තුළින් අපට ලැබෙන වාසිය කුමක්ද යන්න පිළිබඳවත් මම මෙතකදී දැනගැනීමට කැමතියි.

**ගරු සභාපති සිරිල් මුණසිංහ මහතා**

මෙහි වාසිය වන්නේ නාගරික සංවර්ධන අධිකාරිය හරහා මෙම කටයුතු ඉටුකිරීම තුළින් ඉතාමත් කෙටි කාලයක් තුළ මෙම ඉඩම අත්පත් කරගැනීමට හැකියාව ලැබෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මානවඩුගේ කැලුම් ජානක මහතා**

අම්පිටිය වැවෙහි ඇවිදින මංතීරුව පිළිබඳව මම කතා කරන්නට කැමැතියි. බෙලිඅත්ත බල ප්‍රදේශයේ මුල සිටම නගර සැලැස්මක් තිබුණේ නැහැ. අද වන විට මෙම මංතීරුව ඉදිකිරීමට රුපියල් කෝටි තුනකට ආසන්න මුදලක් වැය කරලා තිබෙනවා. නමුත් බල ප්‍රදේශයේ ජනතාවගේ මූලික අවශ්‍යතාවයක් වන වැසිකිළි පද්ධතියක් සකස් කිරීමට මෑතක් වන තුරුම අපට නොහැකි වෙලා තිබුණා. දැන් තමයි එහි වැඩ කටයුතු අවසන් කරලා තිබෙන්නේ. වරින්වර බලයට පත්වන දේශපාලන පක්ෂවල බලධාරීන්ගේ අවශ්‍යතාවය පරිදි ප්‍රදේශය යම් යම් ස්ථානවල යම් යම් දේ සකස් කරනවා. මේ සියළු ඉදිකිරීම් කළේ master plan එකකට අනුව නොවෙයි. මිනිසුන්ට ඇවිදින්නට ඕනෑ තරම් ස්ථාන තිබියදී රුපියල් කෝටි තුනකට ආසන්න මුදලක් වැය කර අම්පිටිය වැවෙහි ඇවිදින මං තීරුවක් සකස් කලා. එය කොතරම් දුරට සාර්ථක ද යන්න පිළිබඳව අප සිතා බැලිය යුතුයි. මේ රට මේ තත්වයට පත්වී ඇත්තේ සැලසුමක් නොමැතිව කටයුතු කිරීම නිසයි. අවසානයේ අප නගරයට නගර සැලැස්මක් නිර්මාණය කළා. ඒ නිසා ඒ අනුව මින් ඉදිරියට වැඩ කටයුතු සිදු කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

**ගරු සභාපති සිරිල් මුණසිංහ මහතා**

මෙම ඇවිදින මංතීරුවෙහි වැඩ කටයුතු අවසන් කර ප්‍රාදේශීය සභාවට භාර දීම සඳහා මෙම පාර්ශවය අවස්ථා දෙකකදීම පැමිණියා. නමුත් අප විසින් එය භාරගැනීම ප්‍රතික්ෂේප කළා. අද වන විට එම ස්ථානය මන්ත්‍රීවරුන් කැලෑවක් බවට පත්වෙලා තිබෙන්නේ. අපි මුලින්ම කිව්වෙ මෙම මං තීරුව සකස් කිරීමේ දී ප්‍රාදේශීය සභාවේ අධීක්ෂණය යටතේ එය සිදු කරන ලෙසයි. නමුත් ඔවුන් එසේ සිදු කළේ නැහැ. මගේ ධුර කාලය තුළ ප්‍රාදේශීය සභාවේ කිසිම දේපලක් කිසිම කෙනෙකුට පූජා කරලා නැහැ. මම සිදුකරන සියලුම දේ සිදුකලේ ඉතාමත් නීත්‍යානුකූලවයි. බෙලිඅත්ත නගරයේ ස්ටේෂන් එකක් හා අධිවේගී මාර්ගයක් ගෙන ඒමට මම විශාල මහන්සියක් දැරුවා. බෙලිඅත්ත නගරයේ ඉදිකිරීම් සිදු කළේ අනවශ්‍ය ආකාරයටයි. නමුත් අපි මාස්ටර් ප්ලෑන් එකක් හැදුවා.

රක්ෂණ සංස්ථාව සතු ඉඩමත් මේ බෙලිඅත්ත නගරයට අත්‍යාවශ්‍ය ඉඩමක්. එය අප ලබාගන්නේ රුපියල් කෝටි පහකට ආසන්න මුදලක් රක්ෂණ සංස්ථාවට ගෙවලා. බෙලිඅත්ත නගරයේ යම් යම් ඉඩම් ප්‍රාදේශීය සභාවට පවරා ගැනීමේදී මට යම් යම් බලපෑම් ආවා. නමුත් මම ඒවාට බිය නොවී මෙම කටයුතු සිදුකළා. මගේ මේ ධූර කාලය තව මාස හයකින් දීර්ඝ වුණොත් මම මේ ප්‍රාදේශීය සභාව තුළ විශාල පෙරළියක් සිදු කරනවා.

ඒ අනුව බෙලිඅත්ත අම්පිටිය වැවෙහි ඇවිදින මංතීරුවට දුම්රියපොල අසලින් පිවිසුම් මාර්ගයක් ස්ථාපිත කිරීම සඳහා අදාළ ඉඩම් කොටස හා බෙලිඅත්ත ලුණු කඩේ හන්දියේ රක්ෂණ සංස්ථාව සතු ඉඩම අත්පත් කර ගැනීම නාගරික සංවර්ධන අධිකාරිය මගින් සිදු කිරීම සඳහා ඊට අදාල වන මුදල නාගරික සංවර්ධන අධිකාරියට ගෙවීමේ යෝජනාව ඒකමතිකව සභා සම්මත කරන ලදි.

## 07(II). පුවක්දණ්ඩාව පැරණි ආදාහනාගාරය අලුත්වැඩියා කිරීමේ යෝජනාව

යෝජනාකරු -: ගරු සභාපති සිරිල් මුණසිංහ මහතා

ගරු සභාපති සිරිල් මුණසිංහ මහතා විසින් ගෙන එන ලද එකී යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දයාරත්න ගුණවර්ධන මහතා විසින් ස්ථිර කරන ලදී.

**ගරු සභාපති සිරිල් මුණසිංහ මහතා**

මුලින්ම මෙම ආදාහනාගාරයේ මළ සිරුරු ආදාහනය කළේ දැව, අඟුරු බවට පත් කරලා. නමුත් පසුව ගෑස් භාවිතා කරලා තමයි මෙහි ආදාහන කටයුතු කළේ. පසුව අප විසින් ඉතාමත් වෙහෙසක් දරලා නව ආදාහනාගාරයක් ඉදි කළා. ඒ ආදාහනාගාරය මුළු ලංකාවම කතා කරන ආදාහනාගාරයක් බවට පත්වුණා. තංගල්ල, මාතර සෑම තැනකම ආදාහනාගාර කැඩුණත් අපේ බෙලිඅත්ත ආදාහනාගාරය කැඩුණේ නැහැ. නමුත් අද වන විට විශාල අලුත්වැඩියාවක් කිරීම සඳහා සති තුනකට ආසන්න කාලයක් මෙය වසා දැමීමට සිදු වෙලා තිබෙනවා. මෙම නව ආදාහනාගාරයේ දිනකට මරණ තුනක් හෝ හතරක් පමණ ආදාහනය කරනවා. එම නිසා මෙම ආදාහනාගාර ඉතා ඉක්මනින්ම අබලන් වීම සිදු වෙනවා. ඒ වගේම විවේකයක් නොමැතිව එක දිගටම ආදාහනාගාරය තුළ මළ සිරුරු පිළිස්සීම නිසා මෙම ආදාහනාගාරයේ රේල් පීලි නිතරම ගිනිබත් වීම මත ඒවා ඇද ගැසීමකට ලක් වී තිබෙනවා.

ආදාහනාගාරය අලුත්වැඩියා කිරීම සිදුකළ හොත් දිනකට මරණ පහක් වුවත් පහසුවෙන් ආදාහනය කිරීමට අපට හැකියාව ලැබෙනවා. එසේම එවිට මෙම ආදාහනාගාරය සඳහා යම්කිසි විවේක කාලයක් ලැබෙන බැවින් කෙටි කාලයකින් නැවත අලුත්වැඩියාවන් සඳහා යාමට අපට සිදු වන්නේ නැහැ. එසේ කළහොත් මෙම ආදාහනාගාරය අබලන් නොවී දීර්ඝ කාලයක් පවත්වාගෙන යාමට හැකියාව තිබෙනවා. මෙය මිනිසුන්ගේ අත්‍යවශ්‍ය අවශ්‍යතාවයක්. එම නිසා මම යෝජනා කරන්නේ මෙම ආදාහනාගාරය අලුත්වැඩියා කර ජනතාවගේ අවශ්‍යතාවය සඳහා මෙය භාවිතා කිරීමට හැකිවන ආකාරයට සකස් කරන ලෙසයි. ඒ සඳහා ඇස්තමේන්තුවක් ගෙන අදාල වැඩ කටයුතු කරන ලෙස මා යෝජනා කර සිටිනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.පී.නිමල් ජයන්ත මුතුමාල මහතා</u>

සෑම දිනකම මෙම ආදාහනාගාරයේ ආදාහන තුනක් හතරක්ම සිදුවෙනවා. එම නිසාමය ඉතාමත් ඉක්මනින් අබලන් වීම සිදු වෙනවා. එම නිසා එයට විසඳුමක් ලෙස මෙම පැරණි ආදාහනාගාරය අලුත්වැඩියා කිරීම සිදුකිරීම සුදුසුයි. මීට පෙරදී මෙම පැරණි ආදාහනාගාරය කඩා ඉවත් කිරීමටත් යෝජනා වුණා. නමුත් ඒවා ක්‍රියාත්මක නොවූ නිසා තමයි අද මෙය මේ තත්වයේ පවතින්නේ. අලුත් ආදාහනාගාරයේ බිත්ති යම් යම් තැන්වලින් ගිලා බැස තිබෙනවා. අද වන විට වීරකැටිය, තංගල්ල අදාහනාගාර වසා තිබෙනවා. මෙම ආදාහනාගාරයත් අබලන් වීම නිසා ජනතාව දැඩි අපහසුතාවයකට පත්වෙලා තිබෙනවා. මෙම පැරණි ආදාහනාගාරය හොඳින් පිරළිසකර කිරීම සිදු කලහොත් කිසිදු ගැටලුවකින් තොරව දිනකට ආදාහන තුනක් හතරක් වුවත් සිදු කිරීමට හැකියාව ලැබෙනවා. මෙසේ අලුත්වැඩියා කිරීමේදී අලුත් ආදාහනාගාරය ආකාරයෙන්ම, පැරණි ආදාහනාගාරයත් මිනිසුන්ගේ ආකර්ෂණය ලබාගත් හැකි ආකාරයට පිළිසකර කලයුතු වනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මයුර සිසිරනාත කොඩිතුවක්කු මහතා</u>

වර්තමානයේ ජනතාව මුහුණ පා සිටින ආර්ථික තත්ත්වය, කාල වේලාව හා පහසු බව යන හේතූන් මත විශාල වශයෙන් ආදාහන කටයුතු සඳහා ජනතාව පෙළඹී සිටිනවා. එමෙසේ පැරණි ආදාහනාගාරය අලුත්වැඩියා කිරීම සඳහා දරන වැය අපට අයකර ගැනීමට කොපමණ කාලයක් ගතවේ යන්න පිළිබඳවත් අප මෙහිදී සිතා බැලිය යුතුයි. එසේම මෙම ආදාහනාගාර දෙකම එකවර ක්‍රියාත්මක වීම නිසා පරිසරයට සිදුවන හානිය පිළිබඳවත් අප නිරන්තරයෙන්ම සිතා බැලිය යුතුයි. අප ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමේදී ඉන් ලැබෙන දිගුකාලීන හා කෙටිකාලීන බලපෑම් පිළිබඳව සිතා බැලිය යුතුයි. මේ ප්‍රදේශ පුරාම ආදාහනාගාර අබලන් වීම නිසා ජනතාව විශාල වශයෙන් අපහසුතාවයකට පත්වෙලා තිබෙනවා. එම නිසා මේ සියලු කරුණු පිළිබඳව සිතා බලා මේ සඳහා සුදුසුම ක්රියාමාර්ගය ගන්න කියලා මම මෙහිදී ප්‍රකාශ කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී  මානවඩුගේ කැලුම් ජානක මහතා</u>

මෙම අආදාහනාගාර සංකල්පය මතු වුයේ නගරයේ ජනතාවට ඔවුන්ගේ ඉඩකඩ සීමා වීම මත ඔවුන්ට භූමදාන කටයුතු ඉටු කර ගැනීමට ඉඩකඩ නොමැති වීම නිසයි. නමුත් වර්තමානය වන විට ගම්බද විශාල වශයෙන් ඉඩම් හිමි ග්‍රාමීය ජනතාව මේ සඳහා යොමු වී තිබෙනවා. එම නිසා මෙහි අවශ්‍යතාව දැඩිව ඇති වෙලා තිබෙනවා. මෙම අදාහනාගාරය නැවතත් අලුත්වැඩියා කළත් තවත් නොබෝ දිනකින් නැවත අබලන් වෙනවා. එම නිසා මා යෝජනා කර සිටින්නේ ජනතාවට මෙහි යථාර්ථය පැහැදිලි කර දී ගම්බද විශාල වශයෙන් ඉඩම් හිමි ග්‍රාමීය ජනතාවට භූමදාන කටයුතු කරන ලෙස අපි දැනුවත් කරමු. මෙතැනදී සුදුසු ක්‍රියාමාර්ගය වන්නේ එයයි.

<u>ගරු සභාපති සිරිල් මුණසිංහ මහතා</u>

මෙය විය යුතු කාරණාවක්. මෙම ආදාහනාගාර වල දිනකට මළසිරුරු දෙකක් තුනක් ආදාහනය කලත්, ඉන් පරිසරයට විශාල බලපෑමක් සිදුවන්නේ නැහැ. වර්තමානයේ වන විට භූමදාන කටයුතු කරනවාට වඩා ආදාහන කටයුතු කිරීම ජනතාවට ඉතාමත් පහසුවක් වෙනවා. එසේම කොවිඩ් උවදුරෙන් පසුව ඉතා විශාල වශයෙන් ජනතාව ආදාහන කටයුතු සඳහා යොමු වී තිබෙනවා. මම ආදාහනාගාර සංකල්පය ගෙන ආවේ විලියම් වන්නිආරච්චි මහතා විසින්ය. මෙම යෝජනාව ඉතාමත් කාලෝචිත යෝජනාවක් වගේම ජනතාවට දැනෙන යෝජනාවන්ද වෙනවා.

ඒ අනුව පුවක්දණ්ඩාව පැරණි ආදාහනාගාරය අලුත්වැඩියා කිරීම් සම්බන්ධයෙන් වූ යෝජනාව විරෝධතාවයකින් තොරව ඒකමතිකව සභා සම්මත කරන ලදි.

**07(III).පළාත් පාලන මැතිවරණය කල් තැබීමේ යෝජනාව හා මහ මැතිවරණයක් හෝ ජනාධිපතිවරණයක් පැවැත්වීමට බල කිරීමේ යෝජනාව**

යෝජනාකරු -: ගරු සභාපති සිරිල් මුණසිංහ මහතා

ගරු සභාපති සිරිල් මුණසිංහ මහතා විසින් ගෙන එන ලද එකී යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මනෝජ් ලසන්ත විදානගම මහතාවිසින් ස්ථිර කරන ලදී.

**ගරු සභාපති සිරිල් මුණසිංහ මහතා**

මාර්තු 19 වන දිනට පළාත් පාලන ආයතනවල ධුර කාලය අවසන් වෙනවා. විපක්ෂයේ වැඩිදෙනෙකු ඉල්ලා සිටින්නේ මෙම පළාත් පාලන මැතිවරණය පවත්වන ලෙසයි. මැතිවරණයක් ඉල්ලීමට සාධාරණ හේතු තිබිය යුතුයි. පළාත් පාලන මැතිවරණයක් පවත්වා සිදු කළ හැකි දෙයක් තිබෙනවාද. රටට අවශ්‍ය වන්නේ ජනාධිපතිවරණයක්ද, මහමැතිවරණයක් ද, පළාත් පාලන මැතිවරණයක් ද යන්න පිළිබඳව ඔබේ අදහස් දක්වන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඩබ්.උදේශිකා හර්ෂනී මහත්මිය**

අද වන විට අපේ රට දැඩි ආර්ථික අපහසුතාවයකට පත්වෙලා තිබෙනවා. එවැනි අවස්ථාවක ජනාධිපතිවරණයක් හෝ මහ මැතිවරණයක් හෝ පළාත් පාලන මැතිවරණයක් පැවැත්වීමට මම දැඩි සේ විරුද්ධයි. පාර්ලිමේන්තු මැතිවරණයක් පැවැත්වීම තුළින් පාර්ලිමේන්තුවේ දැනට සිටින 225 ම තමයි නැවත ඒ තැනට ගේන්නේ. අපේ රටේ තීන්දු තීරණ ගැනීමට හැකියාව තිබෙන්නේ ජනාධිපතිවරණයකින් ද, මහ මැතිවරණයකින්ද, පළාත් පාලන මැතිවරණයයෙන්ද කියා අපි සොයා බැලිය යුතුයි. මේ රටේ දැනට රටේ දැනට පවතින උග්‍ර බෙහෙත් හිඟය, විදුලි බිල් වැඩි වීම, බඩු මිල වැඩිවීම ආදියට විසඳුම වන්නේ මැතිවරන පැවැත්වීම නොවේ. මෙවැනි අවධියකදී මැතිවරණයකට වියදම් නොකරන එම මුදල් ඵලදායි ආර්ථික කටයුත්තකට යොදවනවා නම් එය ඵලදායී වනවා යැයි මා විශ්වාසය කරනවා.

මෑත අතීතයේද දී අපේ රටේ විශාල කොරෝනා උවදුරකට මුහුණ දුන්නා. ඒ වගේම රටේ විශාල වශයෙන් ගෑස් පෝලිම්, තෙල් පෝලිම් තිබුණා. නමුත් වර්තමානය වන විට ඒවා නැවත යථා තත්ත්වයට පත්වෙමින් පවතිනවා. වර්තමාන ජනාධිපතිවරයා විසින් මේ සඳහා විසඳුම් ලබා දීලා තිබෙනවා. එම නිසා මගේ මතය නම් ජනාධිපතිවරණවරණයක් හෝ මහ මැතිවරණයක් පැවැත්වීම සුදුසු නොවන බවයි. එසේම මා යෝජනා කර සිටින්නේ පළාත් පාලන මැතිවරණය කල් තබන ලෙසයි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ.ටී.සී.වෙදආරච්චි මහතා**

මට සිතෙන ආකාරයට මේ යෝජනාව සභාපතිතුමාගේ වුවමනාව මත ඉදිරිපත් වූ යෝජනාවක් නොවේ. මෙය දේශපාලනමය අවශ්‍යතාවය මත ගෙන ආ යෝජනාවක් ලෙසයි මට හැඟී යන්නේ.අපි ප්‍රාදේශීය සභාව තුළ සිතටම ප්‍රාදේශීය සභා මැතිවරණය කල් දාන්න යැයි ප්‍රකාශ කිරීම කොතරම් දුරට නිවැරදිද කියා සිතන්න. වර්තමානය වන විට ජනතාව කතා කිරීමට පෙළඹී ඇත්තේ රටේ තිබෙන ආර්ථික අර්බුදය පිළිබඳවයි. මෙම ආර්ථික අර්බුදය ඉබේ පහළ වූ ආර්ථික අර්බුදයක් නොවයි. මෙය මේ රට වසර 75 ක කාලයක් පුරා පාලනය කර පාලකයින් විසින් නිර්මාණය කළ ආර්ථික අර්බුදයක් ලෙසයි මා දකින්නේ. එය මෑත භාගයේ දී ඉතාමත් තීව්‍ර වෙමින් අද ඉතාමත් උග්‍ර ආර්ථික අර්බුදයකට රටේ ජනතාව මුහුණපා සිටිනවා. මේවාට වගකිය යුත්තෝ කවුරුන්ද.

කඩාවැටෙමින් තිබූ ග්‍රීසියේ බැදුම්කර වල ආයෝජනය කිරීමට එවකට මහ බැංකුව අධිපති කබ්රාල් මහතාට උපදෙස් ලබා දී ඇත්තේ රාජපක්ෂ ඇතුළු එවකට සිටි පාලනයකයින්ය. එසේම මහා බැංකුවේ බැඳුම්කර ඔවුන්ට හිතවත් පාර්ශ්වයන්ට ලබා දී මහ බැංකුව ඒ තැනට ගෙන ආවේ කවුරුන්ද යන්නයි මෙතනදි වැදගත් වන්නේ. නමුත් මෙම සියලු චෝදනා සඳහා වර්තමානයේ සියලු දෙනා රාජ්‍ය නිලධාරීන්ට දෝෂාරෝපණය කරමින් සිටිනවා. එවකට සිටි දේශපාලඥයින් විසින්ම තමයි මේ රාජ්‍ය නිලධාරීන් එතැනට ගෙන ආවේ. වර්තමානය වන විට මෙම ක්‍රියාදාමයම නිරවුල් කිරීමට නොහැකි ආරවුලක් බවට පත් වී තිබෙනවා. මෙවායේ ප්‍රතිඵලයක් ලෙසයි මේ ආර්ථික අර්බුදය නිර්මාණය වී

ඇත්තේ. මෙම ආර්ථික අර්බුදයෙන් ගොඩ ඒමට නම් අපට දේශපාලන ස්ථාවරත්වය අත්‍යාවශ්‍ය වෙනවා. රටක් ආර්ථික වශයෙන් ශක්තිමත් වීමට නම් දේශපාලන ස්ථාවරත්වය අත්‍යාවශ්‍යම සාධකයක් බවට පත්වෙනවා. අප ඡන්දයක් තියා බලාපොරොත්තු වෙන්නේ එම දේශපාලන ස්ථාවරත්වය නිර්මාණය කර ගැනීමයි. රටක් ආර්ථික වශයෙන් ශක්තිමත් වීමට නම් ඒ රට තුළ ආර්ථික නිදහස, දේශපාලන ස්ථාවරත්වය, සමානාත්මතාවය තිබිය යුතුයි. ජාතික ජනල බලවේගයක් විදිහට ඒ කරුණු අපි න්‍යායිකවම දන්නවා. මෙවැනි දේ නොමැති රටක් කිසිදිනක ඉදිරියට නොයන බව අපි දන්නවා.

බහුතර බලයක් නොමැති රනිල් වික්‍රමසිංහ මහතා අද වන විට ජනතාවට කඳුළුගෑස් ගසමින් පහර දෙමින් කටයුතු කරනවා. ඔහුට මෙම මැතිවරණ කල් දැමීමට කිසිදු අයිතියක් නැහැ. ප්‍රාදේශීය නායකයින් මෙවැනි ක්‍රියා නිවැරදියැයි කියනවානම් අපට රටක් ලෙස කිසිදිනක ඉදිරියට යාමෙ ැකියාවක් නැහැ. පළාත් පාලන මැතිවරණය ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතියක්ය. මැතිවරණයක් තැබීමෙන් බලාපොරොත්තු වන්නේ රටේ ජනතාවගේ මතය තිබෙන්නේ කොතනද යන්න විමසීමයි. ඉන්පසුව එම ජනතා මතයට අනුව රට පාලනය සකස් කළ යුතුයි. මෙම මැතිතිවරණය කල් දැමීමට ප්‍රධානතම හේතුව, රටේ පවතින මුදල් නොමැති ප්‍රශ්නය නොවෙයි., මෙම මැතිවරණය තුළින් ජාතික ජන බල වේගය ජයග්‍රහණයය කරන බව ඔවුන් දන්නා නිසයි මොවුන් මෙම මැතිවරණය කල් තැබීම සිදු කරන්නේ..

ඩොලරය ආයුධයක් බවට පත්කර ගනිමින් ජනමාධ්‍ය භාවිතා කරමින් රටේ තිබෙන සියළුම ප්‍රශ්න යට ගසමින් පවතිනවා. නමුත් මෙම ඩොලරයේ අගය වැඩිවීම කෘතිමව නිර්මාණය කල එකක්.ඩොලරය ශක්තිමත් වීමට නම් රටේ ආනයන වලට වඩා අපනයන වැඩි විය යුතුයි. නමුත් එසේ තත්ත්වයක් ඇතිවූයේ නැහැ. වර්තමානයේ වනවිට ඩොලර් ඉල්ලන ප්‍රමාණය අඩුවීමක් පවතිනවා.එසේම ජනතාව සතුව පවතින ඩොලර් ඔවුන් ඉක්මනින් රුපියල් බවට පත් කිරීමට පෙළඹී සිටිනවා. එම මතයි, ඩොලරයේ අගය වැඩිවීම කෘතිමව නිර්මාණය වී ඇත්තේ. රනිල් වික්‍රමසිංහ මහතා අපේක්ෂා කරන්නේ රටේ ආර්ථික තත්ත්වය යථාතත්වයට පත් කිරීමෙන් පසු මැතිවරණයක් පැවැත්වීමටයි. නමුත් මේ ආර්ථික තත්ත්වය යථාතත්වයට පත් කර ගැනීමට විශාල කාලයක් ගත වෙනවා. ඒ සඳහා දිගුකාලීන සැලැස්මක් අත්‍යාවශ්‍ය වෙනවා.මේ ආර්ථික තත්ත්වය යථාතත්වයට පත් කිරීමට නම් දේශපාලන ස්ථාවරත්වය අත්‍යාවශ්‍ය කරුණක් බවට පත්වෙනවා. මෙම දේශපාලන ස්ථාවරත්වය ගොඩ නැඟීමට නම්, අනිවාර්යෙන්ම ප්‍රජාතන්ත්‍රවාදී ආයතන නැවතත් ශක්තිමත් කළ යුතුයි. ඒ සඳහා මැතිවරණයකට යාම සිදු කළ යුතුමයි. එම නිසා මෙම යෝජනාවට අපි සම්පූර්ණයෙන් විරුද්ධයි. අප යෝජනා කරන්නේ රටේ දේශපාලන ස්ථාවරත්වය ගොඩනැගීම සඳහා ප්‍රජාතන්ත්‍රවාදී ආයතන ශක්තිමත් කිරීමට නම් අනිවාර්යයෙන්ම මැතිවරණ පැවැත්විය යුතුය යන්නයි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මයුර සිසිරනාත කොඩිතුවක්කු මහතා</u>**

අද වන විට වැඩි වශයෙන් කතාබහට ලක්වී ඇත්තේ වසර 75 ක් පුරාවට සිදු කළේ කුමක්ද යන්නයි. මේ වසර 75 පුරාවට අපත් කිසියම් වසර ගණනාවක් මෙහි වැඩ කටයුතු සිදු කළ තිබෙනවා. 1988 වර්ෂයේදී සකස් කර ප්‍රාදේශීය සභා පනතින් ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාට විශාල බලතල පුමානයක් පැවරී තිබෙනවා. සභාපතිවරයාට ලැබී ඇති ව්‍යවස්ථාපිත බලය මගින් තමන්ට හිතෛෂී පරිදි වැඩ කටයුතු සිදු කිරීමට හැකියාව ලැබෙනවා. නමුත් මේ අණ පනත් වෙනස් විය යුතුයි. මෙම අණ පනත් වෙනස් නොවී නැවතත් වෙනත් අයෙකු මෙහි සභාපතිවරයා වුණත් එහිදී සිදුවන්නේත් මෙම ක්‍රියාදාමයමයි. මෙහි වෙනසක් සිදුවීමට නම්, මෙම අණපනත් වෙනස් විය යුතුයි. පළාත් පාලන මැතිවරණයක් පැවැත්විය යුත්තේ වෙනස්වීම් සිදුවීමත් සමඟමයි. එසේ නොමැතිව කිසි දිනෙක මෙහි වෙනසක් සිදු කිරීමට හැකියාවක් ලැබෙන්නේ නැහැ. මෙම සභාපති තනතුරට කවුරුන් පත් වුවත් ඔහු ඔහුගේ බලතල භාවිතා කරමින් තමන්ට අවශ්‍ය දේ සිදුකරනවා.

මේ අවස්ථාවේදී යම් යම් පාර්ශවයන්ට මැතිවරණය පැවැත්වීම තුළින් යම් යම් වාසි සහගත තත්ත්වයන් පවතිනවා. ඔවුන් එම නිසා මෙම මැතිවරණය පවත්වන ලෙස බලපෑම් කරනවා. නමුත් මේ වසර 75 පුරාවටම ඔවුන්ගේ පක්ෂ වලිනුත් යම් යම් ජනතා නියෝජිතයින් පාර්ලිමේන්තුව තුළ කටයුතු කළ බවට ඔවුන්ට දැන් අමතකව ගොස් තිබෙනවා. ඔවුනුත් අද රට පත් වී තිබෙන මෙම තත්වයට වගකිව යුත්තෝ වෙනවා. කිසිම පුද්ගලයකුට ඒ වගකීමෙන් නිදහස් වීමට හැකියාව ලැබෙන්නේ නැහැ. ප්‍රාදේශීය සභාවක් තුල වුවත් යම් යෝජනාවක් ගෙන ආ විට එය ක්‍රියාත්මක වන්නේ බහුතර කැමැත්ත මතයි. එම නිසා මේ වගකීමෙන් මේ කිසිම පුද්ගයෙකුට නිදහස් වීමට හැකියාවක් නැහැ. 1988 වර්ෂයේ දී ක්‍රියාත්මක වූ නීතිරීති

අණපනත් තමයි අදටත් ක්‍රියාත්මක වන්නේ. නමුත් ඒවා සංශෝධනය විය යුතුයි. නැතිනම් මේ ප්‍රාදේශීය සභා නිවැරදිව ක්‍රියාත්මක වීමට හැකියාවක් ලැබෙන්නේ නැහැ. මෙම අනපණත් සකස් කරන්නේ පාර්ලිමේන්තුව තුලයි. එහි සිටින කිසිදු මන්ත්‍රීවරයෙකු මෙම අණපණත් සංශෝධනය කිරීමට කිසිදු යෝජනාවක් ගෙන එන්නේ නැහැ. පාර්ලිමේන්තුවේ සිටින මන්ත්‍රීවරුන් ඇතැම්විට ප්‍රාදේශීය සභාව වල සිටි මන්ත්‍රීවරු නොවේ. ඔවුන් මේ අණපනත් පිළිබඳව කිසිදු දැනුවත් භාවයක් නැහැ.මේවායේ තිබෙන හිතකර අහිතකර තත්ත්වයන් පිළිබඳව ඔවුන්ට දැනුවත් භාවයක් නැහැ. එම මන්ත්‍රීවරුන් ඉල්ලා සිටින්නේ මෙම ප්‍රාදේශ සභා මැතිවරණය පවත්වන ලෙසයි.

අද වන විට බදු පනත් සංශෝධනය කරන ලෙස විශාල වශයෙන් උද්ඝෝෂණ පෙළපාලි ක්‍රියාත්මක වෙනවා. නමුත් ඒවායේ සිටින්නේ ඉතාමත් අඩු පඩියක් ලබන නිලධාරීන්. මේ පිළිබඳව අප මෙතැනදී කිසිදු පුද්ගලයකුට දෝෂාරෝපණය කිරීමක් සිදුකරන්නේ නැහැ. අපේ රටට ගැළපෙන බදු පනත් රටේ ක්‍රියාත්මකත විය යුතුයි. අපි මහජන නියෝජිතයින් විදිහට කිසියම් යෝජනාවක් ගෙන ආ විට එහි හරි වැරදි දෙපැත්තම පිළිබඳව සිතා බලා නිවැරදි තීරණයක් ගැනීමට අප කටයුතු කළ යුතුයි. එසේ නොකර අපි පක්ෂයේ, විපක්ෂය කියා පිල් බෙදීමකට ලක්වීම තුළින් සිදුවන්නේ මේ රට තවත් පරිහානියට පත්වීම පමණයි.

පාර්ලිමේන්තුව තුළින් නිර්මාණය කරන සකස් කරන අණපනත් ක්‍රියාත්මක කරන්නේ ප්‍රාදේශීය සභාව හරහාය. ප්‍රාදේශීය සභාව තුළින් යම් දූෂණයක් වංචාවක් සිදු වේ නම් ඒවා නිවැරදි කිරීමට තමයි ප්‍රාදේශීය සභා සභිකයින් පත් කරන්නේ. එම නිසා අද ප්‍රාදේශීය සභා මැතිවරණයක් වෙනුවට මහා මැතිවරණයක් පැවැත්වීම තමයි සුදුසු වන්නේ. රටේ තිබෙන තත්ත්වය සලකා බලා මැතිවරණයක් පවත්වනවාද නැද්ද යන්න පිළිබඳව තීරණ ගැනීමට අයිතිය පවතින්නේ පාර්ලිමේන්තුවටයි. කිසියම් පාර්ශවයකට මේ අවස්ථාවේදී වාසියක් ලැබෙනවානම් ඒ වාසිය තකා මැතිවරණය පැවැත්වීම නෙමෙයි මෙතැනදී විය යුත්තේ. මම මෙහි දී ස්වාධීන පුද්ගලයකු වශයෙන් කතා කරන්නේ. මම මෙහි දී යෝජනා කරන්නේ ප්‍රාදේශීය සභා මැතිවරණය කල්තබා මහ මැතිවරණයක් හෝ ජනාධිපතිවරණයක් පවත්වන ලෙසයි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.පී.ප්‍රභාත් චන්ද්‍ර කුමාර මහතා</u>

පලාත් සභා මැතිවරණය, ප්‍රාදේශීය සභා මැතිවරණය, ජනාධිපතිවරණය, මහ මැතිවරණය වශයෙන් අප රටේ මැතිවරණ හතරක් ක්‍රියාත්මක වනවා. මේ මැතිවරණ හතරම ඉතාමත් වැදගත්. මේ අතරින් ජනතාවට වඩාත් සමීපතම මැතිවරණය වන්නේ පළාත් පාලන මැතිවරණයයි. මෙහිදී මැතිවරණ කල් තැබීම සුදුසුයි කියලා මම කියන්නේ නැහැ. සත්‍යය වශයෙන්ම මේ මැතිවරණය තුළින් ජනතාවගේ කැමැත්ත ඉටු වන්නේ නැහැ. පසුගිය ප්‍රාදේශීය සභාව මැතිවරණයෙන් ජයග්‍රහණය ලබා මේ සභාවට මන්ත්‍රීවරුන් දහසය දෙනෙක් පත්වුණා. නමුත් පැරදුණු සියළු පක්ෂය නියෝජනය කරමින් විපක්ෂය තුළ සභිකයින් දහතුන් දෙනෙක් මේ සභාව තුළ සිටිනවා. මේක ඉතාමත් විකෘති තත්ත්වයක්.

මේ තත්ත්වය අප වෙනස් කළ යුතුයි. සියලු පක්ෂ මේ සඳහා කැමතිනම්, මේ කොට්ඨාශ ක්‍රමයෙන් පවත්වන සභිකයින් ප්‍රමාණය අඩු කරන්න අපි කටයුතු කරමු. දැනට 8000 කට ආසන්න ප්‍රමාණයක් මහජන නියෝජිතයින් ප්‍රාදේශීය සභාව සියල්ලේම සිටිනවා.ඉන් 4750 ක් පමණ තේරී පත්වන්නේ කොට්ඨාශය වලින්ය. 60% ක් ඡන්දයෙන් හා 40% ක් අනුපාත ක්‍රමයෙන් පත්වන්නේ. අනුපාත ක්‍රමයෙන් පත්වන නියෝජිතයින් ප්‍රමාණය ඉතාමත් වැඩියි. මෙතැනදී අනවශ්‍ය වියදමක් තමයි රට දරන්නේ. සීමා නිර්ණය ක්‍රියාත්මක වෙද්දී, මැතිවරණය පවත්වා නැවතත් මෙවැනි පිරිසක්ම මෙම සභාවට ගෙන ඒම තුලින් නැවතත් මේ රටට අනවශ්‍ය වියදමක් දැරීමට සිදුවෙනවා. එම නිසා මේ ක්‍රමය වෙනස් කරලා අලුත් ක්‍රමවේදයක් යටතේ මේ මැතිවරණය පැවැත්වීම සුදුසුය කියා මා යෝජනා කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.පී.නිමල් ජයන්ත මුතුමාල මහතා</u>

සභාපතිතුමාගේ යෝජනාව වන්නේ පළාත් පාලන මැතිවරණය කල් තැබීම හා ජනාධිපතිවරණයක් හෝ මහමැතිවරණයක් පැවැත්වීමට බලකිරීමේ යෝජනාවයි. ඔබතුමාට මෙහි දී එක් කාරණාවක් අමතක වුනා. එනම්, ජනමත විචාරණයක් පැවැත්වීමයි. 1983 වර්ෂයේ පැවැත්වීමට නියමිතව තිබූ මහමැතිවරණයෙන් ජනතාව විමුක්ති පෙරමුණෙන් සභිකයින් පාර්ලිමේන්තුවට පැමිණියේ යැයි තිබෙන විශ්වාසය මත 1982 වර්ෂයේදී ජනමත විචාරණයක් ගෙන එන ලදි. 1983 වර්ෂයේ දී උතුරේ බිම් බෝම්බයකට හසු වී හමුදා

සෙබළුන් 13 දෙනෙකු ජීවිතක්ෂයට පත්වුණා. එම මළ සිරුරු ජේ ආර් ජයවර්ධන මහතා විසින් බොරැල්ල කනත්තට ගෙනවිත් භූමදානය කිරීම පදනම් කරගනිමින් මේ රට තුල ඇති වූ කැරැල්ල මත අවසානයේදී එයට නිර්මාපකයන් ලෙස ජනතා විමුක්ති පෙරමුණ 1983 වර්ෂයේදී තහනම් කරන ලදී. 1953 වර්ෂයේ දී මේ රට තුළ හර්තාලයක් ක්‍රියාත්මක වුණා. නමුත් ඒ අවධියේ දී ජනතා විමුක්ති පෙරමුණ තිබුණේ නැහැ.

ඔබතුමා ගෙන එන ලද යෝජනාව තුළින් පැහැදිලි වන්නේ පළාත් පාලන මැතිවරණය නොපවත්වා මහමැතිවරණයක් හෝ ජනාධිපතිවරණයක් පැවැත්වීමයි. නමුත් මෙහි සිටින කිසිදු පක්ෂයක් මේ මැතිවරණය පවත්වන යැයි යෝජනා කළේ නැහැ. මෙය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන්ම මතු වූ කාරණාවක්. 2018 වර්ෂයේ දී පැවති මහමැතිවරණය තුළින් ඔබතුමන්ලා මුළු කොට්ඨාස දහසයම ජයග්‍රහණය කලා. මේ කොට්ඨාශ ක්‍රමය යටතේ තේරී පත්වන සභිකයින් ප්‍රමාණය ඉතාමත් වැඩියි. අපිත් එය පිළිගන්නවා. අපේ ධූර කාලය අවසන් වීම හේතුකොටගෙන මැතිවරණයක් පැවැත්වීමට මැතිවරණ කොමිෂන් සභාවට අයිතියක් පවතිනවා. එසේම මැතිවරණය පැවැත්වීම සඳහා අයවැයෙන් ප්‍රතිපාදන වෙන් කර තිබෙනවා. මෙතන දී දේශපාලනමය ගැටලුවක් මතු වන්නේ නැහැ. මේ මැතිවරණය පැවැත්වීමට නාම යෝජනාව කැඳවා තිබියදී සහ රාජ්‍ය සේවකයින් මෙම මැතිවරණය සඳහා ඉදිරිපත් වී ඔවුන් වැටුප් නොලබා සිටිය දී ජනාධිපතිවරයා විසින් මැතිවරණය නොපවත්වන බවට ප්‍රකාශ කිරීම ඉතාමත් වැරදියි.

මීට ඉහතදී මැතිවරණ පැවැත්වීමේ දී සමානුපාතික ක්‍රමය මත පළාත් පාලන ආයතන වලට සභිකයින් පත් කිරීම සිදු වුණා. බෙලිඅත්ත ප්‍රාදේශීය සභාවට මේ මත සභිකයින් දහ හතර දෙනෙකු පත්වුවා. ඉන්පසුව කොට්ඨාශ ක්‍රමය ක්‍රියාත්මක වුණා. මේ සභාවල සිටි සභිකයින් විසින්මයි මෙහි කොට්ඨාස වෙන් කිරීම සිදු කලේ. එහිදී ඇතිවූ ගැටලුව වූයේ මෙම කොට්ඨාස දහසයෙන්ම එකම පක්ෂය ජයග්‍රහණය කළහොත් සිදු වන්නේ කුමක්ද යන්නයි. එයට විසඳුමක් ලෙස ලැයිස්තු ක්‍රමය ආවා. මේ හේතු මත මේ සභාවට පත්වන ජනතා නියෝජිතයින් ප්‍රමාණය වැඩිවීම සිදු වුණා. මේවාට වගකිව යුත්තේ 2006 වර්ෂයේ දී පත්ව සිටි රාජපක්ෂ ආණ්ඩුවයි. වර්තමානයේ සීමා නිර්ණය තුලින් අපේක්ෂා කරන්නේ සභා දෙකක් එකට එකතු කිරීමයි. වර්තමානය වන විට මේ මැතිවරණය කල් දැමීමට ප්‍රබලව කටයුතු කරන්නේ මේ රට තුල වරින් වර බලයට පත්වන ප්‍රධාන පක්ෂ දෙකයි. මේ ප්‍රබල පක්ෂ දෙක වටා ජනතාව ඒකරාශී නොවී වෙනත් බලවේගයක් කරා ජනතා ඒකරාශි වීම නිසයි මෙම මැතිවරණය කල් දැමීමට උත්සාහ කරන්නේ.

මෙම මැතිවරණය පැවැත්වීම සඳහා මෙවර අයවැයෙන් රුපියල් බිලියන දහයක් වෙන්කර තිබෙනවා. එසේම රාජ්‍ය සේවකයින් මේ අවස්ථාවේදී රටේ පවතින ආර්ථික තත්වය හේතු කොටගෙන රටේ පවත්වන ඕනෑම මැතිවරණයක් සඳහා වැටුප් එම කටයුතුවලට දායක වීමට කැමැත්ත ප්‍රකාශ කරලා තිබෙනවා. ඔබතුමාගේ මේ යෝජනාවට මා විරුද්ධ වෙනවා. මම යෝජනා කර සිටින්නේ මේ රට තුළ මෙම මැතිවරණ තුනම පවත්වන ලෙසයි. අපගේ පක්ෂය මේ පළාත් පාලන මැතිවරණය, මහා මැතිවරණය හා ජනාධිපතිවරණය යන මැතිවරණ තුනම පවත්වනවාට කිසිම විරුද්ධතාවක් නැහැ. මේ මැතිවරණයන් ස්වාභාවිකව නිර්මාණය වූ මැතිවරණයි. එම නිසා ජනතාව කැමැති ඕනෑම දේශපාලන පක්ෂයක් මේ වෙලාවේදී ඉදිරියට ගෙන ඒමට ඔවුන්ට හැකියාව තිබෙනවා.

ජාතික ජන බලවේගයක් ලෙස මේ රටතුල පවත්වන ඕනෑම මැතිවරණයක් සඳහා අපි සූදානම්. එසේම මෙවැනි යෝජනාවක් මේ සභාවට ගෙන ඒමට හැකියාව තිබෙනවා ද යන්න පිළිබඳවත් මට මෙහිදී ගැටලුවක් තිබෙනවා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් පැවැත්විය යුතු මැතිවරණයක් මේ කල් දැමීමට රටේ ජනාධිපතිවරයාටත් වෙනත් කිසිදු පාර්ශවයකටවත් හැකියාවක් ලැබෙන්නේ නැහැ. මේ මැතිවරණ පැවැත්වීම තුළින් ජනතාව ඉතාමත් හොඳ තීරණයක් ලබාදේ යැයි මා විශ්වාස කරනවා. ජාතික ජන බලවේගය ලෙස අපගේ පක්ෂයේ එකඟතාවය වන්නේ අපි මෙම මැතිවරණ තුනම සඳහා ඉදිරිපත් වීමට සූදානම් බවයි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මානවඩුගේ කැලුම් ජානක මහතා</u>

1973 වර්ෂ වලදී මේ රටේ බලයට පත් වූ සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය විසින් මේ රට තුළප ශීඝ්‍ර සංවර්ධනයක් කරා රැගෙන ආවා. මෙතුමිය බලයට පත්වීමෙන් පසු මේ රට තුළ තිබූ වාමාංශික අර්බුදකාරි තත්වය නිමා කරමින් දේශීය නිෂ්පාදන ආර්ථිකයක් නිර්මාණය කරන ලදී. මෙම ක්‍රමවේදය අදටත් මේ රට තුළ ක්‍රියාත්මක වූවානම්, මේ රට මේ ලෙස පරිහානියට පත්වන්නේ නැහැ. ඉන් පසු මෙරට තුළ ඇති වූ

ඝාතන රැල්ලට වගකිව යුත්තන් වන්නේ ජනතා විමුක්ති පෙරමුණයි. මොවුන් විසින් අපේ රටේ තිබූ දේශීය කර්මාන්ත ශාලා සියල්ල විනාශයට පත් කරන ලදී. එය මේ රටේ සියලුම දෙනා දන්න කාරණාවක් බවට අද පත්වී තිබෙනවා.

1978 වර්ෂයේ දී බලයට පත් වූ ජේ ආර් ජයවර්ධන මහතා විසින් මේ රටට විවෘත ආර්ථික ක්‍රමය හඳුන්වා දෙන ලදී. ඒ තුළින් මේ රටේ ශීඝ්‍ර දියුණුවක් කරා ගෙන යාමට ඔහුට හැකියාව ලැබුණි. ඉන්පසු 1988 වර්ෂයේ දී නැවතත් ජනතා විමුක්ති පෙරමුණ විසින් මේ රට පුරා ඝාතන රැල්ලක් නිර්මාණය කරන ලදී. ඒ තුළින් මේ රටේ තිබූ ශිෂ්ඨ සම්පන්නභාවය සම්පූර්ණයෙන්ම විනාශයට පත්විය. එදා මොවුන් විසින් සිදුකරන ලද මෙම ක්‍රියාවලියට හේතුව වූයේ 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඔවුන් විරුද්ධ වීමයි. නමුත් වර්තමානය වන විට ජනතා විමුක්ති පෙරමුණේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරිය විසින් මෙම 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කරන්න යැයි යෝජනා කර සිටිනවා.මේ රට වර්තමානයේ පත්වී තිබෙන මේ තත්වයට ජනතා විමුක්ති පෙරමුණ ලෙස ඔවුනුත් වගකිව යුතුයි.

2015 වර්ෂයේ දී යහපාලන ආණ්ඩුව බලයට පත්වන ලදී. ඔවුන් විසින් රාජ්‍ය සේවක වැටුප් වැඩිකරමින්, ඉන්ධන හා බඩු මිල විශාල වශයෙන් පහත හෙළමින් මේ රටේ තිබූ ණය නිසියාකාරව ගෙවමින් නගර සංවර්ධනය කටයුතු විශාල ලෙස සිදු කරමින් අධ්‍යාපන ක්‍රමය වෙනස් කරමින් ඒවාට සහන ලබාදෙමින් මේ රට තුළ විශාල සේවයක් ඉටු කරන ලදී. ඉන්පසු 2019 වර්ෂයේදී ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයා මෙරට ජනාධිපතිවරයා වශයෙන් තේරී පත්විය. එවකට රටේ පැවති ආර්ථික තත්වය සහ අනෙකුත් හේතු පදනම් කරගෙන මේ රට තුළ නිර්පාක්ෂික අරගලයක් නිර්මාණය විය. මේ හේතු පදනම් කරගනිමින් එවකට ජනාධිපති වූ ගෝඨාභය රාජපක්ෂ මහතා ජනතා විමුක්ති පෙරමුණේ නායක අනුර කුමාර දිසානායක මහතාට මෙන්ම සජිත් ප්‍රේමදාස මහතාට මේ රට බාර ගෙන කටයුතු කරන ලෙස ඉල්ලීම් කරන ලදී. නමුත් මේ රට භාර ගැනීමට එම කිසිදු අයෙකු ඉදිරිපත් වූයේ නැහැ. ඉන්පසු අවසානයේ දී රනිල් වික්‍රමසිංහ මහතා මේ රට භාර ගැනීමට ඉදිරිපත් විය.

රනිල් වික්‍රමසිංහ මහතා විසින් මේ රටේ තිබුණු පෝලිම යුගය අවසන් කරමින් ජනතාවට යම් මට්ටමකට සහන සලසමින් මේ රට යථා තත්ත්වයට පත්කිරීමට උත්සාහ දරමින් සිටිනවා. ජනතාවගේ මූලික අවශ්‍යතාවය වන්නේ මැතිවරණයක් පැවැත්වීම නොවේ. වර්තමානය වන විට ජනතාව අපේක්ෂා කරන්නේ ඔවුන්ගේ මූලික අවශ්‍යතා ඉටුකර ගනිමින් ජීවත් වීමටයි. නමුත් මැතිවරණයක් සඳහා මේ කාලය සුදුසු වන්නේ නැහැ. රටේ ජනතාව ඉතාමත් ආර්ථික අපහසුතාවයකින් මේ අවස්ථාවේදී සිටින්නේ. එම නිසා ඔවුන්ට මේ ඡන්දය පැවැත්වීම අත්‍යාවශ්‍ය කාරණාවක් නොවෙයි. මුලින්ම මේ ජනතාවගේ මූලික අවශ්‍යතා ඉටු කිරීම කලයුතු වෙනවා. මැතිවරණයක් පැවැත්විය යුත්තේ ඉන් පසුවයි.

මැතිවරණයක් පැවැත්වුවත්, කිසි දිනක ජනතා විමුක්ති පෙරමුණට ඉන් ජයග්‍රහණය කිරීමට හැකියාව ලැබෙන්නේ නැහැ. මම එය අත්දැකීමෙන්ම දන්නවා. මේ රටේ දැන් යහපත් අතට පත්වෙමින් පවතිනවා. සම්පූර්ණයෙන් විනාශ වූ රටක් ගොඩ ගැනීමට එක සැරේට හැකියාවක් කිසිම පුද්ගලයෙකුට නැහැ. අපි කියන්නේ මැතිවරණයක් තියන්න එපා කියලා නෙවෙයි. අපි ඉල්ලා සිටින්නේ මේ මැතිවරණය පැවැත්වීම යම්කිසි කාලයකට කල් තබන ලෙසයි. රට යම්කිසි ස්ථාවරත්වයකට පැමිණිය පසු ඡන්දය තැබීම සුදුසුයි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී. චමිල ප්‍රේමනාත් මහතා</u>

මා නියෝජනය කරන පක්ෂය ඇතුළු සියලුම පක්ෂ තමන්ට වාසි සහගත වන ආකාරයට තමයි මේ මැතිවරණය පැවැත්වීමට බල කරන්නේ. ජනතා විමුක්ති පෙරමුණත් ජාතික ජනබලවේගයේ නමින් අදත් සිදු කරන්නේ එම ක්‍රියාදාමයි. ඔවුන් විසින් ඔවුන්ගේ පක්ෂයට වාසි සහගතය අවස්ථාවේ දී ඡන්දයක් තබන ලෙස බලපෑම් කරනවා. 2017 වර්ෂයේ දී පැවැත්වීමට තිබූ පළාත් සභා මැතිවරණය වසර එකහමාරකින් කල් දැමීම සිදුකළා. ඒ අවස්ථාවේදී මේ කිසිදු පක්ෂයක් ඡන්දයක් පවත්වන ලෙස බලපෑම් කළේ නැහැ. උද්සෝෂණය කළේ නැහැ. නමුත් වර්තමානයේ රට මුහුණ පා ඇති තත්වයන් සමඟ ජනතා විමුක්ති පෙරමුණ විසින් ඡන්දයක් පවත්වන දෙසට උද්සෝෂණ, පෙළපාලි කරමින් සිටිනවා.

ජනතා විමුක්ති පෙරමුණ ෆේස්බුක් මාධ්‍ය යොදා ගනිමින් වසර 77 ක සාපයක් පිළිබඳව කතා කරමින් පවතිනවා. ඒ වසර 77 පුරාවට ඔවුනුත් මේ දේශපාලනය තුල සිටි බව ඔවුන්ට දැන් අමතකව ගොස් තිබෙනවා. මොවුන් මැතිවරණය පවත්න ලෙස බලපෑම් කරන්නේ ජනතාවගේ සුභසිද්ධිය උදෙසා නොවෙයි. ඔවුන් මේ කටයුතු කරන්නේ පක්ෂය රැක ගැනීම සඳහාය. මේ රට වර්තමානය වන විට යම්කිසි යහපත් තත්ත්වයකට පත්ව ඇති බව අප සියලු දෙනා දන්නා කාරණාවක් බවට පතවෙලා තිබෙනවා. ඩොලරයේ අගය මේ වන විට ශක්තිමත් වෙමින් පවතිනවා. මෙය අපගේ අවසාන සභාව විය හැකියි. අපි සියලු දෙනා මේ අවස්ථාවේදී සතුටින් කටයුතු කරමු.

**<u>ගරු උප සභාපති එම්.ජී.විරාජ් ලලන්ත ගලප්පත්ති මහතා</u>**

දැන් වසර 77 ක සාපයක් පිළිබඳව කතා කරනවා. මේ වසර 77 පුරාවට මේ පාර්ලිමේන්තුව තුල 225 ම සිටියා. මේ 225 තුළ රටට සේවයක් කළ මන්ත්‍රීවරුන් කණ්ඩායමකුත් සිටියා. එදා අරගලකරුවන් ප්‍රකාශ කලේ මේ 225 ම අම් රටට අවශ්‍ය නොවන බවයි. අපිත් කියන්නේ මේ මැතිවරණය අවශ්‍යයි. නමුත් මෙය ඒ සඳහා සුදුසු කාලය නොවෙයි. මේ මැතිවරණය යම්කිසි කාලයකට කල් තබා ඒ කාලසීමාව තුළ එකතුවන මුදලුත් මේ සඳහා යොදා ගන්නා ලෙසයි. අපි ජනතාවට කළ හැකි සේවය මේ සභාව තුළ සිට කරනවා. අපි මේ සභාව තුළින් මුදල් හම්බ කිරීමක් සිදු කරලා නැහැ.අපි ජනතාවට සේවයක් කලා.

**<u>ගරු සභාපති සිරිල් මුණසිංහ මහතා</u>**

මේ පළාත් පාලන මැතිවරණය පැවැත්වීමට කිසිදු හේතුවක් නැහැ. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ වරිපණම් බදු අය වෙනවානම්, පාරවල් ටික කැපෙනවානම්,කුණු ටික අදිනවානම් මේ ප්‍රාදේශීය සභාවේ වැඩකටයුතු මේ කාර්ය මණ්ඩලය තුලින් සිදු කරන්න පුලුවන්.අත්‍යාවශ්‍ය නොවන මෙම ප්‍රාදේශීය සභා මැතිවරණය සඳහා කෝටි1800 කට ආසන්න මුදලක් වැය කිරීමෙන් අවසානයේ සිදු වන්නේ නැවතත් 8000 කට ආසන්න මන්ත්‍රීවරුන් ප්‍රමාණයක් බිහිවීමයි. අදවන විට රෝහල් වලට අවශ්‍ය බෙහෙත්, පිළිකා රෝහලට අවශ්‍ය බෙහෙත්, මිනිසුන්ට අවශ්‍ය ආහාර,ගොවීන්ට අවශ්‍ය තෙල් පොහොර වල හිඟතාවයක් තිබෙනවා.මේ ප්‍රාදේශීය සභා මැතිවරණය පැවැත්වීම තුලින් මේ ජාතික ගැටලුව විසඳීමට හැකියාව ලැබෙන්නේ නැහැ.

මෙම ගැටලුව විසඳීමට නම් ජාතික මැතිවරණය පැවැත්විය යුතුයි.ජාතික ජනබල වේගයවත්, සජබවත් අද ජාතික මැතිවරණයකට යාමට සූදානම් නැහැ.මොවුන්ගේ මූලිකම අභිප්‍රාය වන්නේ ප්‍රාදේශීය සභා තුල තිබෙන ආසන සංඛ්‍යාව වැඩි කර ගැනීම පමණයි. නමුත් අප මෙය විසුරුවා හරිනවාට කැමතියි.මේ රට යම් තත්වයකට පගෙන එනවානම් අපි ඒ නායකයාට සහයෝගය ලබා දෙනවා.මේ අවස්ථාවේ දී රටේ ජනතාව වෙනුවෙන් රනිල් වික්‍රමසිංහ මහතාට ලබා දියහැකි සහයෝගය මම ලබා දෙනවා.අද වන විට ජනතාව විශාල අපහසුතාවයකින් සිටින්නේ.අද මේ උත්සෝෂණ කරන කිසිම කෙනෙක් ඒ ජනතාවට බඩු මල්ලක්වත් දෙන්න ඒ මිනිස්සු ලඟට යන්නෙ නැහැ.ගිය මාසය වන විට සංචාරක ව්‍යාපාරය හේතුවෙන් අපේ රටට රුපියල් කෝටි 10,000 කට ආසන්න මුදලක් ලැබී තිබෙනවා. ඒ තුලින් අපේ රටේ තිබෙන ඩොලර් ප්‍රමාණය ඉහල ගොස් තිබෙනවා. මේ රට ගොඩනැගිය යුත්තේ මේ තුලින්ය. රටේ ජනතාව ගෝඨාභය මහතා ඒ තනතුරෙන් නෙරපා හරින විට සජිත් මහතාට,අනුර කුමාර මහතාට මේ තනතුර භාර ගැනීමට ඉදිරිපත් වීමට තිබුණා.නමුත් ඔවුන් විසින් එසේ ඉදිරිපත් වුනේ නැහැ. අවසානයේ රනිල් වික්‍රමසිංහ මහතා මේ රට භාර ගත්තා. අපි කොතරම් කතා කලත්, අපි අපේ හෘද සාක්ෂියට අනුව කටයුතු කල යුතුයි.මේ පළාත් සභාව විසුරුවා හැරීම තුලින් මසකට විසි එක්කෝටි හැත්තෑ පන්ලක්ෂයක් පමණ මේ රටට ඉතිරි වෙනවා. ඒ නිසා අපි ඉල්ලා සිටින්නේ පළාත් සභාව විසුරුවා හැර ජාතික මැතිවරණයක් හෝ මහමැතිවරණයක් පවත්වන ලෙසයි.

## <u>07(IV). M-Code-IT සොලියුෂන් ආයතනය සමඟ කළමණාකරන තොරතුරු පද්ධතිය 2023.04.01 සිට 2024.03.31 දින දක්වා සේවා ගිවිසුම අලුත්කිරීමේ යෝජනාව</u>

යෝජනාකරු -: ගරු සභාපති සිරිල් මුණසිංහ මහතා

ගරු සභාපති සිරිල් මුණසිංහ මහතා විසින් ගෙන එන ලද එකී යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.පී.ශාන්ත මහතා විසින් ස්ථිර කරන ලදී.

**ගරු සභාපති සිරිල් මුණසිංහ මහතා**

බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව සඳහා MCODE IT SOLUTIONS ආයතනය විසින් ස්ථාවර වත්කම්, ගබඩා හා තොග පාලන පද්ධති, පුද්ගලික ලිපි ගොනු කළමනාකරණ පද්ධතිය, ලේඛනාගාර තොරතුරු පද්ධතිය සහ රථවාහන කළමනාකරණ පද්ධතිය යන මෘදුකාංග සඳහා වාර්ෂික සේවා ගිවිසුමකට එළඹිය යුතු වෙනවා. ඒ සඳහා පසුගිය වසර කිහිපයකම සේවා ගිවිසුමකට එළඹ තිබෙනවා.

ඒ අනුව 2023/04/01 දින සිට 2024/03/31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා සේවා ගිවිසුම දීර්ඝ කිරිමටත් ඒ සඳහා වන පසු සේවා ගාස්තු වන රුපියල් 72,000.00 ක මුදල MCODE IT SOLUTIONS ගෙවීම් කිරිමටත්,සුදුසු බවට වූ යෝජනාව මා මේ ගරු සභාවට යෝජනා කරනවා.

ඒ අනුව තොරතුරු පද්ධති හතරට අදාල පසු සේවා ගිවිසුමට එළඹීමටත් ඒ සඳහා වන පසු සේවා ගාස්තු වන රු. 72 000.00 ක මුදල MCODE IT SOLUTIONS ආයතනයට ගෙවීම් කිරිමටත් ඒ සඳහා 2023/04/01 දින සිට 2024/03/31 දින දක්වා ගිවිසුම් ගතවිමටත් විරෝධතාවයකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

**07(V). හිඟ ව්‍යාපාර බදු හා කර්මාන්ත බදු නිරීකෂණය සම්බන්ධයෙන් වූ යෝජනාව**

යෝජනාකරු -: ගරු සභාපති සිරිල් මුණසිංහ මහතා

ගරු සභාපති සිරිල් මුණසිංහ මහතා විසින් ගෙන එන ලද එකී යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ජී.ජී.හෙලන් පුෂ්ප කුමාර මහතා විසින් ස්ථිර කරන ලදී.

**ගරු සභාපති සිරිල් මුණසිංහ මහතා**

හිඟ ව්‍යාපාර බදු හා කර්මාන්ත බදු නිරීක්ෂණය සම්බන්ධයෙන් අදාල විෂයභාර නිලධාරීන් විසින් මේ සභාවට ලිපියක් ඉදිරිපත් කර තිබෙනවා. එහි සඳහන් වන්නේ මෙම හිඟ ව්‍යාපාර බදු අයකර ගැනීම සඳහා 2023.03.10 දින බෙලිඅත්ත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල ක්ෂේත්‍ර පරීක්ෂාවක් සිදු කල බවයි. එහිදී අනාවරණය වූයේ 2017 වර්ෂයේ සිට 2018.12.31 දින දක්වා මෙම ව්‍යාපාර හා කර්මාන්ත බදු හිඟව පවතින බවයි. එසේම මෙම ව්‍යාපාර දැනට එම ස්ථානයේ නොමැති බවත් ඒවා වසා දමා ඇති බවත් ඒ තුලින් දැනගැනීමට ලැබුණි. ඒ අනුව මෙම ව්‍යාපාර බදු අයකර ගැනීමට නොහැකි තත්ත්වයක් උද්ගත වී ඇති බැවින් එම ව්‍යාපාර බදු මුදල රුපියල් 45,050.00 ක මුදල එම ලේඛණන වලින් කපා හැරීම සඳහා සභා තීරණයක් ලබා එය දකුණු පළාත් ගරු ආණ්ඩුකාර තුමා ඉදිරිපත් කිරීමට මේ තුලින් අනුමැතිය ඉල්ලා ඇත.

ඒ අනුව, අයකර ගැනීමට නොහැකි ව්‍යාපාර බදු මුදල වන රුපියල් 45,050.00 ක මුදල එම ලේඛණන වලින් කපා හැරීම සුදුසු බවත්, එම සභා තීරණය දකුණු පළාත් ගරු ආණ්ඩුකාර තුමා ඉදිරිපත් කිරීමට සුදුසු බවත් මා මේ ගරු සභාවට යෝජනා කරනවා.

ඒ අනුව, අයකර ගැනීමට නොහැකි ව්‍යාපාර බදු මුදල වන රුපියල් 45,050.00 ක මුදල එම ලේඛණන වලින් කපා හැරීම සුදුසු බවත්, එම සභා තීරණය දකුණු පළාත් ගරු ආණ්ඩුකාර තුමා ඉදිරිපත් කිරීමට සුදුසු බවටත් වූ යෝජනාව විරෝධතාවයකින් තොරව ඒකමතිකව සභා සම්මත කරන ලදි.

**07(VI). රාජකාරී හැඳුනුම්පත් සහ තනතුරු නාම පුවරු සකස් කිරීම සම්බන්ධයෙන් වූ යෝජනාව**

යෝජනාකරු -: ගරු සභාපති සිරිල් මුණසිංහ මහතා

ගරු සභාපති සිරිල් මුණසිංහ මහතා විසින් ගෙන එන ලද එකී යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වී.පි.තිbccලක් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදී.

**ගරු සභාපති සිරිල් මුණසිංහ මහතා**

බෙලිඅත්ත ප්‍රාදේශීය සභා කාර්යාලයේ නිලධාරීන් හඳුනාගැනීම සඳහා තනතුර සහ නම ඇතුළත් නාමපුවරුවද, සියලුම නිලධාරීන්ට රාජකාරි හැඳුනුම්පතක් ද ලබාදීමට අවශ්‍ය වන බව කාර්යාලයේ අභ්‍යන්තරය විගණන නිලධාරීනිය විසින් මේ සභාවට ලිපියක් ඉදිරිපත් කර තිබෙනවා. ක්ෂේත්‍ර රාජකාරි කටයුතු සඳහා නිළධාරීන් කාර්යාලයෙන් බැහැරව යාමේදී දැඩි දුෂ්කරතාවයන්ට පත්වන බැවින් රාජකාරිය හැඳුනුම්පත් ලබා දීම ඉතා අවශ්‍ය බව එතුමිය පවසා සිටිනවා.

ඒ අනුව, බෙලිඅත්ත ප්‍රාදේශීය සභා කාර්යාලයේ නිලධාරීන් හඳුනාගැනීම සඳහා තනතුර සහ නම ඇතුළත් නාමපුවරුවද, සියලුම නිලධාරීන්ට රාජකාරි හැඳුනුම්පතක් ද ලබාදීමට සුදුසු බව මා මේ ගරු සභාවට යෝජනා කර සිටිනවා.

ඒ අනුව, බෙලිඅත්ත ප්‍රාදේශීය සභා කාර්යාලයේ නිලධාරීන් හඳුනාගැනීම සඳහා තනතුර සහ නම ඇතුළත් නාමපුවරුවද, සියලුම නිලධාරීන්ට රාජකාරි හැඳුනුම්පතක් ද ලබාදීම සම්බන්ධයෙන් වූ යෝජනාව විරෝධතාවයකින් තොරව ඒකමතිකව සභා සම්මත කරන ලදි.

**07(VII).බෙලිඅත්ත බස් නැවතුම්පොල පොදු වැසිකිළිය සම්බන්ධයෙන් ලංසු මුදල සංශෝධනය කර ටෙන්ඩර් කැඳවීම සම්බන්ධයෙන් වූ යෝජනාව**

යෝජනාකරු -: ගරු සභාපති සිරිල් මුණසිංහ මහතා

ගරු සභාපති සිරිල් මුණසිංහ මහතා විසින් ගෙන එන ලද එකී යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බැදිගම පතිරණගේ ලසන්ත මහතා විසින් ස්ථිර කරන ලදී.

**ගරු සභාපති සිරිල් මුණසිංහ මහතා**

බෙලිඅත්ත බස් නැවතුම් පොල පොදු වැසිකිළිය සඳහා 2003 අප්‍රේල් මස 01 වන දින සිට ටෙන්ඩර්පත් කැඳවූවත් ඒ සඳහා කිසිඳු ටෙන්ඩර්කරුවකු ඉදිරිපත් වූයේ නැහැ. මේ සම්බන්ධයෙන් පසුගිය සභාවේ දී යෝජනා වූයේ, දිනකට රුපියල් 100.00 බැගින් මාසයක් සඳහා රු.3000.00 හා වසරකට රු.36,000.00 ක ලංසුවක් මේ සඳහා අය කිරීමටයි. නමුත් මේ ලංසු මුදල ගෙවා මෙම ටෙන්ඩර්පත ලබා ගැනීමට කිසිදු පුද්ගලයකු මේ සඳහා ඉදිරිපත් වී නැහැ. එමනිසා සභාවේ සේවක මහතෙක් යොදවා බෙලිඅත්ත බස් නැවතුම් පොල පොදු වැසිකිලිය පවත්වාගෙන යාම සඳහා කටයුතු කරන ලෙස මා මේ සේවාවට යෝජනා කර සිටිනවා.

ඒ අනුව, සභාවේ සේවක මහතෙක් යොදවා බෙලිඅත්ත බස් නැවතුම් පොල පොදු වැසිකිලිය පවත්වාගෙන යාම සඳහා වූ යෝජනාව විරෝධතාවයකින් තොරව ඒකමතිකව සභා සම්මත කරන ලදි.

**07(VIII). 2022.12.31 දිනට ගබඩා සමීක්ෂණ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා අපහරණ කමිටුවක් හා වෙන්දේසි කටයුතු සඳහා කමිටු පත්කර ගැනීම සම්බන්ධයෙන් වූ යෝජනාව**

යෝජනාකරු -: ගරු සභාපති සිරිල් මුණසිංහ මහතා

ගරු සභාපති සිරිල් මුණසිංහ මහතා විසින් ගෙන එන ලද එකී යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වී.පි.තිලක් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදී.

**ගරු සභාපති සිරිල් මුණසිංහ මහතා**

2022.12.31 දිනට ගබඩා සමීක්ෂණ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා අපහරණ කමිටුවක් හා වෙන්දේසි කටයුතු සඳහා කමිටු පත්කර ගැනීම සම්බන්ධයෙන් අදාළ විෂය භාර නිලධාරියා විසින් ලිපියක් ඉදිරිපත් කර තිබෙනවා. එහි සඳහන් වන ආකාරයට, ප්‍රාදේශීය සභාවේ 2022.1.231 දිනට ගබඩා සමීක්ෂණය සිදුකර එහි වාර්තාව ඉදිරිපත් කර ඇති බැවින් එහි සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා ඊට අදාල කමිටු පත් කර දෙන ලෙස ඉල්ලා සිටී. ඒ අනුව වෙන්දේසි කිරීමට ඇති භාණ්ඩ සඳහා තක්සේරු වාර්තාවක් ලබා ගැනීමට සහ වෙන්දේසි කිරීමේ කටයුතු සඳහා පහත නිලධාරීන් පත් කිරීමට සුදුසු බව මා මේ ගරු සභාවට යෝජනා කර සිටිනවා.

1. පී.කේ.පත්මසිරි මහතා — තාක්ෂණ සේවා නිළධාරී
2. කොමුදි හසිනිකා මෙනවිය — තාක්ෂණ සේවා නිළධාරී
3. වී.ආශා දීපානි මිය — සංවර්ධන නිළධාරී
4. ඩබ්.කේ.ඒ.විමලාවතී මිය — සංවර්ධන නිළධාරී
5. කේ.කෞමුදී මුතුහාරා මිය — සංවර්ධන නිළධාරී

ඒ අනුව වෙන්දේසි කිරීමට ඇති භාණ්ඩ සඳහා තක්සේරු වාර්තාවක් ලබා ගැනීමට සහ වෙන්දේසි කිරීමේ කටයුතු සඳහා ඉහත නිලධාරීන් පත් කිරීමට සුදුසු බවට වූ යෝජනාව විරෝධතාවයකින් තොරව ඒකමතිකව සභා සම්මත කරන ලදි.

**07(XI). 2021 වර්ෂයේ ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන යටතේ ක්‍රියාත්මක කිරීමට යෝජිත ව්‍යාපෘතිවලින් එම වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද හා ක්‍රියාත්මක නොකරන ලද හා වැඩ අවසන් නොකරන ලද අවධියේ ව්‍යාපෘති ණයගැති ණයහිමි ලේඛනවලින් ඉවත් කිරීම**

යෝජනාකරු -: ගරු සභාපති සිරිල් මුණසිංහ මහතා

ගරු සභාපති සිරිල් මුණසිංහ මහතා විසින් ගෙන එන ලද එකී යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වී.පි.තිලක් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදී.

**ගරු සභාපති සිරිල් මුණසිංහ මහතා**

ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ 2021 වර්ෂයේ ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන යටතේ ක්‍රියාත්මක කිරීමට යෝජිත ව්‍යාපෘතිවලින් එම වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද හා ක්‍රියාත්මක නොකළ ලද හා වැඩ අවසන් නොකරන ලද අවධියේ ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන මුදල් වෙන් නොකරන බව 2023.03.07 දිනැති ලිපි මඟින් දැනුම් දී ඇත. එබැවින් එම ව්‍යාපෘති ණයගැති ණයහිමි ලේඛනවලින් ඉවත් කිරීම සඳහා යෝජනා කර සිටිනවා. එකි ව්‍යාපෘති ලැයිස්තුව පහත පරිදි වේ.

| අ.අ | ප්‍රතිපාදන ප්‍රභවය | ව්‍යාපෘති අංකය | වර්ෂය | ව්‍යාපෘතියේ නම | | ප්‍රතිපාදන මුදල |
|---|---|---|---|---|---|---|
| 1 | මග නැගුම් අමාත්‍යාංශ අරමුදල් | LA/09/21/BP/398 | 2021 | කුඩාහීල්ල නැගෙනහිර හෙට්ටිආරච්චි මාර්ගය කැටගල් අතුරා සංවර්ධනය කිරීම | මග නැගුම අමාත්‍යාංශය කොළඹ | 2,000,000.00 |
| 2 | මග නැගුම් අමාත්‍යාංශ අරමුදල් | LA/09/21/BP/403 | 2021 | නායකවත්ත තරුණ සේවා මාර්ගයේ ඉතිරි කොටස කොන්ක්‍රිට් කුට්ටි ගල් ඇතිරිම | මග නැගුම අමාත්‍යාංශය කොළඹ | 2,000,000.00 |
| 3 | මග නැගුම් අමාත්‍යාංශ අරමුදල් | LA/09/21/BP/406 | 2021 | වහරක්ගොඩ දකුණ කහවත්ත පන්සල අසල සිට දෙනියකඩ මාර්ගය දක්වා පාරකොන්ක්‍රිට් කුට්ටි ගල් ඇතිරිම | මග නැගුම අමාත්‍යාංශය කොළඹ | 2,000,000.00 |
| 4 | මග නැගුම් අමාත්‍යාංශ අරමුදල් | LA/09/21/BP/425 | 2021 | ගැටමාන්න නැගෙනහිර කොඩිතුවක්කුගොඩ මාර්ගය කොන්ක්‍රිට් කුට්ටි ගල් ඇතිරිම | මග නැගුම අමාත්‍යාංශය කොළඹ | 2,000,000.00 |
| 5 | මග නැගුම් අමාත්‍යාංශ අරමුදල් | LA/09/21/BP/426 | 2021 | මහහීල්ල බටහිර බාංවැල්හේන මාර්ගය කොන්ක්‍රිට් කුට්ටි ගල් ඇතිරිම | මග නැගුම අමාත්‍යාංශය කොළඹ | 2,000,000.00 |
| 6 | මග නැගුම් අමාත්‍යාංශ අරමුදල් | LA/09/21/BP/430 | 2021 | අම්බල බටහිර කැන්දහේන මාර්ගය(නන්දසේන නිවස පාර)කොන්ක්‍රිට් කුට්ටි ගල් ඇතිරිම | මග නැගුම අමාත්‍යාංශය කොළඹ | 2,000,000.00 |
| 7 | මග නැගුම් අමාත්‍යාංශ අරමුදල් | LA/09/21/BP/611 | 2021 | කෝංගස්ලන්ද වටගෙදර මාර්ගයකොන්ක්‍රිට් කුට්ටි ගල් ඇතිරිම | මග නැගුම අමාත්‍යාංශය කොළඹ | 2,000,000.00 |
| 8 | මග නැගුම් අමාත්‍යාංශ අරමුදල් | LA/09/21/BP/612 | 2021 | එදිරිසිංහ මාවතේ සිට හින්නිආර දෙසට මාර්ගයකොන්ක්‍රිට් කුට්ටි ගල් ඇතිරිම | මග නැගුම අමාත්‍යාංශය කොළඹ | 2,000,000.00 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 9 | මග නැගුම් අමාත්‍යංශ අරමුදල් | LA/09/21/BP/627 | 2021 | ශාන්තිපුර 2 වන පටුමගකොන්ක්‍රිට් කුට්ටි ගල් ඇතිරිම | මග නැගුම අමාත්‍යංශය කොළඹ | 2,000,000.00 |
| 10 | මග නැගුම් අමාත්‍යංශ අරමුදල් | LA/09/21/BP/628 | 2021 | අත්මග පාර ඉතිරි කොටසකොන්ක්‍රිට් කුට්ටි ගල් ඇතිරිම | මග නැගුම අමාත්‍යංශය කොළඹ | 2,000,000.00 |
| 11 | මග නැගුම් අමාත්‍යංශ අරමුදල් | LA/09/21/BP/630 | 2021 | සිටිනමළුව ගවසිංහවත්ත පාර පළමු අදියරයේ සංවර්ධනය කිරිම. | මග නැගුම අමාත්‍යංශය කොළඹ | 2,000,000.00 |
| 12 | මග නැගුම් අමාත්‍යංශ අරමුදල් | LA/09/21/BP/631 | 2021 | වීරගේවත්ත මාර්ගයේ 1 වන පටුමගෙහි ඉතිරිකොටස සංවර්ධනය | මග නැගුම අමාත්‍යංශය කොළඹ | 2,000,000.00 |
| 13 | මග නැගුම් අමාත්‍යංශ අරමුදල් | LA/09/21/BP/632 | 2021 | සුහඳ මාවතකොන්ක්‍රිට් කුට්ටි ගල් ඇතිරිම | මග නැගුම අමාත්‍යංශය කොළඹ | 2,000,000.00 |
| 14 | මග නැගුම් අමාත්‍යංශ අරමුදල් | LA/09/21/BP/633 | 2021 | දංගහකොරටුව මාර්ගයකොන්ක්‍රිට් කුට්ටි ගල් ඇතිරිම | මග නැගුම අමාත්‍යංශය කොළඹ | 2,000,000.00 |
| 15 | මග නැගුම් අමාත්‍යංශ අරමුදල් | LA/09/21/BP/423 | 2021 | මහහේනයාය මාර්ගය සංවර්ධනය කිරිමකොන්ක්‍රිට් කුට්ටි ගල් ඇතිරිම | මග නැගුම අමාත්‍යංශය කොළඹ | 2,000,000.00 |
| 16 | මග නැගුම් අමාත්‍යංශ අරමුදල් | LA/09/21/BP/436 | 2021 | නාකුළුගමුව බටහිර ළිඳ මාවතකොන්ක්‍රිට් කුට්ටි ගල් ඇතිරිම | මග නැගුම අමාත්‍යංශය කොළඹ | 2,000,000.00 |

එසේම, 2021 වර්ෂයේ ක්‍රියාත්මක කිරීම සඳහා පහත සඳහන් ව්‍යාපෘති 02 අයවැය ලේඛනයට ඇතුළත් කරන ලදී.නමුත් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ඇස්තමේන්තු සකස් කිරීමේදී වෙන් කරන ලද ප්‍රතිපාදන මුදල ප්‍රමාණවත් නොවුණු බැවින් මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක නොකරන ලදී. එබැවින් ලේඛනවලින් එම ව්‍යාපෘති ඉවත් කර ගැනීම සිදු කළ යුතුය.

- මහහීල්ල ධම්මරතන මාවත කැටගල් අල්ලා සංවර්ධනය කිරීම. 500000.00
- බෙලිඅත්ත පාළුවත්ත ක්‍රීඩාපිටිය සංවර්ධනය කිරීම. 1000000.00

ඒ අනුව, 2021 වර්ෂයේ ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන යටතේ ක්‍රියාත්මක කිරීමට යෝජිත ව්‍යාපෘතිවලින් එම වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද හා ක්‍රියාත්මක නොකරන ලද හා වැඩ අවසන් නොකරන ලද අවධියේ ව්‍යාපෘති ණයගැති ණයහිමි ලේඛනවලින් ඉවත් කිරීමට සුදුසු බවත්, 2021 වර්ෂයේ ක්‍රියාත්මක කිරීම සඳහා අයවැය ලේඛනයට ඇතුළත් කරන ලද ව්‍යාපෘති 02 සඳහා ප්‍රතිපාදන මුදල ප්‍රමාණවත් නොවන බැවින් එම ව්‍යාපෘතීන් දෙකත් ලේඛනවලින් ඉවත් කර ගැනීම සුදුසු බව මා මේ ගරු සභාවට යෝජනා කරනවා.

ඒ අනුව, 2021 වර්ෂයේ ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන යටතේ ක්‍රියාත්මක කිරීමට යෝජිත ව්‍යාපෘතිවලින් එම වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද හා ක්‍රියාත්මක නොකරන ලද හා වැඩ අවසන් නොකරන ලද අවධියේ ව්‍යාපෘති ණයගැති ණයහිමි ලේඛනවලින් ඉවත් කිරීමට සුදුසු බවත්, 2021 වර්ෂයේ ක්‍රියාත්මක කිරීම සඳහා අයවැය ලේඛනයට ඇතුළත් කරන ලද ව්‍යාපෘති 02 සඳහා ප්‍රතිපාදන මුදල ප්‍රමාණවත් නොවන බැවින් එම ව්‍යාපෘතීන් දෙකත් ලේඛනවලින් ඉවත් කර ගැනීම සුදුසු බවට වූ යෝජනාව විරෝධතාවයකින් තොරව ඒකමතිකව සභා සම්මත කරන ලදි.

**08.කාරක සභා වල වාර්තා**

**09.ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ, එකතුකළ අදායම් පිළිබඳ ප්‍රගති වාර්තා සහ ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කිරීමට නියමිත වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම සලකා බැලීම.**

**09 (i).2023 පෙබරවාරි මස ප්‍රා.ස.16 ලැබීම් සාරාංශය සහ ප්‍රා.ස.14 ගෙවීම් සාරාංශය ඉදිරිපත් කිරීම.**

| වැය විෂයන් | එකතුව රු. ශත | අය විෂයන් | එකතුව රු. ශත |
|---|---|---|---|
| 01.වැටුප් හා දීමනා | 6,544,141.80 | 10.වරිපනම් බදු | 468,367.68 |
| 02.ගමන් වියදම් | 14,306.00 | 20.කුලී | 880,096.82 |
| 03.සැ.හා උපකරණ | 466,955.00 | 30.බලපත්‍ර ගාස්තු | 64,074.00 |
| 04.ප්‍රා.ව.අළු හා නඩත්තු | 93,035.00 | 40.සේවා සඳහා ගාස්තු | 586,931.00 |
| 05.ප්‍රා.සම්.හා ආව.සේවා | 190,850.74 | 50.වරෙන්තු ගාස්තු හා දඩ | 180,740.00 |
| 06.පොලී ලා.ප්‍ර.මුදල් | 0.00 | 60.වෙනත් ආදායම් | 44,723.54 |
| 07.ආ.මු.දා.මු.සහනාධාර | 20,275.00 | 70. වෙනත් ආධාර | 5,648,606.67 |
| 08.වි.වැ.ප්‍ර.පාරිතෝෂික | 93,873.90 | 80.මූලධන ලැබීම | 557,500.00 |
| 09.ප්‍රාග්ධන වැය | 0.00 | ස්ථාවර තැ.ආපසු | 0.00 |
| 10.ණය ආපසු ගෙවීම | 0.00 | සේවක ණය | 587,817.00 |
| සේවක ණය | 514,000.00 | තැන්පත් | 95,070.00 |
| තැන්පත් | 134,700.00 | අත්තිකාරම් | 27,341.89 |
| ණය හිමියෝ | 125,356.69 | ණයගැති | 0.00 |
| අත්තිකාරම් | 0.00 | වැය ශීර්ෂයට ආපසු | 152,418.78 |
| අය ශීර්ෂ ආපසු | 0.00 | ගිණුම් මාරු | 0.00 |
| ස්ථාවර තැන්පත් | 0.00 | අහරු චෙක් | 0.00 |
| පෙර ගෙවීම් | 0.00 | ආදායම් හා වෙනත් ලැබීම් | 0.00 |
| ගිණුම් මාරු | 192,781.30 | | |
| **මුළු එකතුව** | **8,390,275.43** | **මුළු එකතුව** | **9,293,687.68** |

ඉහත අංක 09. (1) හි 2023 පෙබරවාරි මස ප්‍රා.ස. 14 හා ප්‍රා.ස. 16 වාර්තා පිළිගැනීමට සුදුසු බව ගරු සභාපති සිරිල් මුණසිංහ මහතා යෝජනා කළ අතර, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ජී.ප්‍රභාත් චන්ද්‍ර කුමාර මහතා විසින් ස්ථිර කිරීමෙන් පසු සභා සම්මත කරන ලදී.

**09.(II) සභා ආවරණ අනුමැතිය යටතේ කළ ගෙවීම් ඇතුලු 2023 පෙබරවාරි මාසයේ කරන ලද සියළුම ගෙවීම් අනුමත කිරීම.**

***පොදු ගිණුම***

| අ.අ | වවුචර් අංකය | කාරණය | මුදල රු. |
|---|---|---|---|
| 1 | 96 | පුවක්දණ්ඩාව ආදාහනාගාරයේ 2022 ජනවාරි මස ජල ගාස්තු ගෙවීම | 3,178.60 |
| 2 | 97 | ඩී.ඒ. රාජපක්ෂ ගොඩනැගිල්ලේ 2022 ජනවාරි මස ජල ගාස්තු ගෙවීම | 46,323.14 |
| 3 | 98 | බෙලිඅත්ත බස් නැවතුම්පොල 2022 ජනවාරි මස ජල ගාස්තු ගෙවීම | 2,042.40 |
| 4 | 99 | පුවක්දණ්ඩාව පුස්තකාලයේ 2022 ජනවාරි මස ජල ගාස්තු ගෙවීම | 4,781.70 |
| 5 | 100 | බෙලිඅත්ත මහජන වැසිකිළියේ 2022 දෙසැම්බර් මස ජල ගාස්තු ගෙවීම | 12,226.57 |
| 6 | 101 | බෙලිඅත්ත පොදු වෙළඳපොල 2022 ජනවාරි මස ජල ගාස්තු ගෙවීම | 24,391.12 |
| 7 | 102 | සභා ඉඩම් සඳහා කම්බි කනු සකස් කිරීමට සිමෙන්ති ලබාගැනීම - සිට්නාමලුව හාඩ්වෙයාර් | 5,800.00 |
| 8 | 103 | කම්බි කනු සකස් කිරීමට සිමෙන්ති ලබාගැනීම - සිට්නාමලුව හාඩ්වෙයාර් | 5,800.00 |
| 9 | 104 | සභා ඉඩම් වල කම්බි ගැසීමට කම්බි කොකු ලබාගැනීම - සිට්නාමලුව හාඩ්වෙයාර් | 12,500.00 |
| 10 | 105 | ලිපි තැපැල් මුද්දර ගාස්තු අලුත් කිරීම | 20,000.00 |
| 11 | 106 | ගලගම පුස්තකාලයට 2022 දෙසැම්බර් මස පුවත්පත් ගාස්තු ගෙවීම - ඩබ්.ජී. ගමගේ | 2,970.00 |
| 12 | 107 | ඉහල බෙලිගල්ල පුස්තකාලයට 2022 දෙසැම්බර් මස පුවත්පත් ගාස්තු ගෙවීම - ඩබ.ඇල්.ජී. නන්ද | 2,480.00 |
| 13 | 108 | මහජන නියෝජිත ඉන්ධන දීමනාව ගෙවීම | 24,000.00 |
| 14 | 109 | 2022 දෙසැම්බර් මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම - සීතා කොඩිකාර | 6,200.00 |
| 15 | 110 | 2022 දෙසැම්බර් මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම - ජී.ඒ. චමිරු තුසර | 3,872.00 |

| | | | |
|---|---|---|---|
| 16 | 111 | 2022 දෙසැම්බර් මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම - කේ.එම්.කේ. මැන්දිස් | 3,872.00 |
| 17 | 112 | 2022 දෙසැම්බර් මස ඉන්ධන දීමනාව ගෙවීම - ප්‍රබෝධිත් ධර්මාජීව | 3,000.00 |
| 18 | 113 | pF-7460 කැබ් රථයේ පූර්ණ වාර සේවාව සිදුකිරීම - ඕෂන්වේස් ඔටෝ සර්විස් | 37,915.00 |
| 19 | 114 | මාර්ග අංශයේ තණකොල කපන යන්ත්‍ර අලුත්වැඩියා කිරීම - ජී.ඩබ්.එච්. ගයාන්ජනී | 33,520.00 |
| 20 | 115 | තණකොල කපන යන්ත්‍ර අංක කිරීමට තීන්ත ලබාගැනීම - ඕෂදී ග්ලස් සෙන්ටර් | 1,350.00 |
| 21 | 116 | කාර්යාලය සඳහා පානීය ජලය ලබාගැනීම - රොහාන් තුඩුවෙත්ත | 3,680.00 |
| 22 | 117 | සභාව සඳහා 8ජීබී පෙන් ඩ්‍රයිව් 2 ක් ලබාගැනීම - එච්.ඒ. විනෝජ් ජයශාන්ත | 3,600.00 |
| 23 | 118 | කාත්ෂණ අංශයේ පරිගණකය අලුත්වැඩියා කිරීම - එච්.ඒ. විනෝජ් ජයශාන්ත | 3,000.00 |
| 24 | 119 | සභාව සඳහා 16ජීබී පෙන් ඩ්‍රයිව් 2 ක් ලබාගැනීම - එච්.ඒ. විනෝජ් ජයශාන්ත | 5,800.00 |
| 25 | 120 | කාර්යාල සංග්‍රහ කටයුතු සඳහා ද්‍රව්‍ය ලබාගැනීම - චන්දිමාල් ෆෑට්සිටි | 2,790.00 |
| 26 | 121 | ආදාහනාගාරය සඳහා පිරවූ ගෑස් සිළින්ඩර් 05 ක් ලබාගැනීම - සිට්නාමලුව හාඩ්වෙයාර් | 93,250.00 |
| 27 | 122 | 2023 ජනවාරි මස අනියම් සේවක වැටුප් ගෙවීම | 1,107,044.87 |
| 28 | 123 | දුම්රිය වාර ප්‍රවේශ පත්‍ර සඳහා මුදල් ගෙවීම | 9,900.00 |
| 29 | 124 | ඇප තැන්පතු මුදල් නිදහස් කිරීම - ඩබ්.පී. රුක්ෂලා | 50,000.00 |
| 30 | 125 | නිල මුද්‍රා 03 ක් සකස් කිරීම - සිරිවර්ධන ප්‍රින්ටර්ස් | 3,100.00 |
| 31 | 126 | 244-1007-8-0022068 ගිණුමෙන් 244.1001.8.0022231 ගිණුමට මුදල් මාරු කිරීම | 192,781.30 |
| 32 | 127 | ගැටමාන්න ග්‍රාමීය පුස්තකාලයේ 2023 ජනවාරි මස පුවත්පත් ගාස්තු ගෙවීම- කේ.ජී.ධමින්ත | 3,160.00 |
| 33 | 128 | මහහීල්ල ග්‍රාමීය පුස්තකාලයේ 2023 ජනවාරි මස පුවත්පත් ගාස්තු ගෙවීම- ඊ.බී. සනත් | 3,160.00 |
| 34 | 129 | අම්බල ග්‍රාමීය පුස්තකාලයේ 2023 ජනවාරි මස පුවත්පත් ගාස්තු ගෙවීම- ඊ.බී. සනත් | 2,840.00 |
| 35 | 130 | මහහීල්ල ග්‍රාමීය පුස්තකාලයේ 2022 දෙසැම්බර් මස පුවත්පත් ගාස්තු ගෙවීම- ඊ.බී. සනත් | 2,840.00 |
| 36 | 131 | ගැටමාන්න ග්‍රාමීය පුස්තකාලයේ 2022 දෙසැම්බර් මස පුවත්පත් ගාස්තු ගෙවීම- ඊ.බී. සනත් | 2,840.00 |
| 37 | 132 | මීගහවෙල ග්‍රාමීය පුස්තකාලයේ 2022 නොවැම්බර් මස පුවත්පත් ගාස්තු ගෙවීම- ඊ.බී. සනත් | 2,910.00 |
| 38 | 133 | මීගහවෙල ග්‍රාමීය පුස්තකාලයේ 2022 දෙසැම්බර් මස පුවත්පත් ගාස්තු ගෙවීම- ඊ.බී. සනත් | 2,900.00 |
| 39 | 134 | පුවක්දණ්ඩාව මහජන පුස්තකාලයේ 2022 දෙසැම්. මස පුවත්පත් ගාස්තු ගෙවීම - කේ.ජී. දමින්ත | 2,830.00 |
| 40 | 135 | නිහිලුව පුස්තකාලයේ 2022 දෙසැම්බර මස පුවත්පත් ගාස්තු ගෙවීම - කේ.ජී. දමින්ත | 2,900.00 |
| 41 | 136 | පුවක්දණ්ඩාව මහජන පුස්තකාලයේ 2023 ජනවාරි මස පුවත්පත් ගාස්තු ගෙවීම - කේ.ජී. දමින්ත | 3,160.00 |
| 42 | 137 | බෙලිඅත්ත මහජන පුස්තකාලයේ 2023 ජනවාරි මස පුවත්පත් ගාස්තු ගෙවීම - ධමින්ත රණසිංහ | 8,830.00 |
| 43 | 138 | බෙලිඅත්ත බස් නැවතුම කියවීම් ඒකකයේ 2023 ජන මස පුවත්පත් ගාස්තු ගෙවීම- කේ.ජී.ධමින්ත | 2,460.00 |
| 44 | 139 | නිහිලුව ග්‍රාමීය පුස්තකාලයේ 2023 ජනවාරි මස පුවත්පත් ගාස්තු ගෙවීම-කේ.ජී.ධමින්ත | 3,110.00 |
| 45 | 140 | 2023 ජනවාරි මස අතිකාල දීමනා ගෙවීම - අමිල දේශප්‍රිය | 3,851.00 |
| 46 | 141 | 2023 ජනවාරි මස අතිකාල දීමනා ගෙවීම - අජන්ත සංජය ගලප්පත්ති | 3,851.00 |
| 47 | 142 | 2023 ජනවාරි මස අතිකාල දීමනා ගෙවීම - නීල් කුමාර | 3,851.00 |
| 48 | 143 | 2023 ජනවාරි මස අතිකාල දීමනා ගෙවීම - ඉන්දික ඒ. කොඩිතුවක්කු | 3,962.00 |
| 49 | 144 | 2023 ජනවාරි මස අතිකාල දීමනා ගෙවීම - නිහාල් රංජිත් ඉලේසිංහ | 3,851.00 |
| 50 | 145 | 2023 ජනවාරි මස අතිකාල දීමනා ගෙවීම - කේ.ජී. ගුණසිරි | 3,851.00 |
| 51 | 146 | 2023 ජනවාරි මස අතිකාල දීමනා ගෙවීම - එස්.එල්.ඒ. ලලිත් කුමාර | 3,888.00 |
| 52 | 147 | 2023 ජනවාරි මස අතිකාල දීමනා ගෙවීම - ඩබ්.ඒ. ජයතිලක | 3,851.00 |
| 53 | 148 | 2023 ජනවාරි මස අතිකාල දීමනා ගෙවීම - ඩබ්. තරිදු මධුශංක | 1,249.00 |
| 54 | 149 | 2023 ජනවාරි මස අතිකාල දීමනා ගෙවීම - කේ.ඒ. දනුෂ් | 3,592.00 |
| 55 | 150 | පරීක්ෂණ වාර්තාවක් ලබාගැනීමට ගාස්තු ගෙවීම - ජේ.ඒ.කේ. වික්‍රමසිංහ | 500.00 |
| 56 | 151 | ගමන් වියදම් ගෙවීම - ප්‍රභා තල්පාවිල | 1,716.00 |
| 57 | 152 | ගමන් වියදම් ගෙවීම - කේ.එම්.කේ. මැන්දිස් | 1,598.00 |
| 58 | 153 | 2023 ජනවාරි මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම - එල්.ඩබ්. අයේෂා උදයංගනී | 1,050.00 |
| 59 | 154 | ගමන් වියදම් ගෙවීම - එස්. මුණසිංහ | 790.00 |
| 60 | 155 | Ll-7643 දරණ කෘ කැබ් රථයේ ආදායම් බලපත්‍රය ,ලබාගැනීමට අත්තිකාරම් මුදල් ගෙවීම | 7,980.00 |
| 61 | 156 | 2022 හතර වන කාර්තුව සඳහා මුද්දර ගාස්තු ගෙවීම | 19,700.00 |
| 62 | 157 | කාර්යාල ෆැක්ස් දුරකථනයේ 2023 ජනවාරි මස දුරකථන ගාස්තු ගෙවීම | 3,794.44 |
| 63 | 158 | සභාපතිතුමාගේ කාර්යාල දුරකථනයේ 2023 ජනවාරි මස ගාස්තු ගෙවීම | 278.01 |
| 64 | 159 | සභාපතිතුමාගේ කාර්යාල දුරකථනයේ 2023 පෙබවාරි මස ගාස්තු ගෙවීම | 4,000.00 |
| 65 | 160 | සභාපතිතුමාගේ රාජකාරී දුරකථනයේ 2023 ජනවාරි මස ගාස්තු ගෙවීම | 8,876.79 |
| 66 | 161 | කාර්යාල ඉන්ටර්නෙට් හා දුරකථන පද්ධතියේ 2023 ජනවාරි මස ගාස්තු ගෙවීම | 18,458.21 |
| 67 | 162 | කාර්යාල අභ්‍යන්තර දුරකථන පද්ධතියේ 2023 ජනවාරි මස ගාස්තු ගෙවීම | 413.84 |

| | | | |
|---|---|---|---|
| 68 | 163 | හිඟ වරිපනම් එකතු කිරීමේ 10% දීමනාව ගෙවීම - ජී.ඒ. චමිරු තුසර | 22,723.61 |
| 69 | 164 | ගමන් වියදම් ගෙවීම - ඒ.ජී. සෙනරත් | 400.00 |
| 70 | 165 | තණකොළ කපන යන්ත්‍ර සඳහා ඉන්ධන ලබාගැනීම - කේ.ඒ.එච් ද සිල්වා | 8,000.00 |
| 71 | 166 | RD-4354 ට්‍රැක්ටරය සඳහා ඔයිල් ලබාගැනීම - අලුත් ආරච්චි ඔයිල් මාට් | 14,500.00 |
| 72 | 167 | 75-3726 ට්‍රැක්ටර් රථයේ පැච් එකක් දැමීම - ජයමුතු ඔටෝ මාට් | 300.00 |
| 73 | 168 | HW-6385 ත්‍රිරෝද රථය අලුත්වැඩියා කිරීම - සිල්වා සයිකල් වර්ක්ස් | 5,900.00 |
| 74 | 169 | PF-7460 කැබ් රථයේ ඔයිල් හා ප්ලග් මාරු කිරීම - චන්දන මෝටර්ස් | 4,150.00 |
| 75 | 170 | 2023 පෙබරවාරි මස සභික දීමනා ගෙවීම | 405,000.00 |
| 76 | 171 | 2023 පෙබරවාරි මස මහජන නියෝජිත දුරකථන දීමනාව ගෙවීම | 27,500.00 |
| 77 | 172 | මහජන නියෝජිත ඉන්ධන දීමනාව ගෙවීම | 48,000.00 |
| 78 | 173 | මහජන නියෝජිත ඉන්ධන දීමනාව ගෙවීම - මනෝජ් විදානගම | 3,000.00 |
| 79 | 174 | ප්‍රායෝගික පුහුණුව ලබන අභ්‍යාසලාභී 2023 ජනවාරි මස දීමනාව ගෙවීම - ඒ.ඒ. නිමාෂා හංසනී | 10,500.00 |
| 80 | 175 | තාක්ෂනික කමිටු සාමාජික දීමනා ගෙවීම | 10,500.00 |
| 81 | 176 | මහජන නියෝජිත ඉන්ධන දීමනාව ගෙවීම 2022 දෙසැම්බර් - සී.පී.බාලාවාරි | 3,000.00 |
| 82 | 177 | මහජන නියෝජිත ඉන්ධන දීමනාව ගෙවීම - සී.පී.බාලාවාරි | 6,000.00 |
| 83 | 178 | 2022 සැප්තැම්බර් මස අතිකාල දීමනා ගෙවීම - ජේ.එල්.ඒ. ජයන්ත | 949.00 |
| 84 | 179 | 2022 ඔක්තෝබර් මස අතිකාල දීමනා ගෙවීම - ජේ.එල්.ඒ. ජයන්ත | 1,899.00 |
| 85 | 180 | 2022 දෙසැම්බර් මස අතිකාල දීමනා ගෙවීම - ජේ.එල්.ඒ. ජයන්ත | 949.00 |
| 86 | 181 | 2023 පෙබරවාරි මස ස්ථිර සේවක වැටුප් ගෙවීම | 4,999,564.83 |
| 87 | 182 | 2023 ජනවාරි මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම - ජී.ඒ. චමිරු තුසර | 3,176.00 |
| 88 | 183 | 2023 ජනවාරි මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම - වී.ඒ. දීපානි | 2,400.00 |
| 89 | 184 | 2023 ජනවාරි මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම - කේ.එම්.කේ. මැන්දිස් | 3,176.00 |
| 90 | 185 | ප්‍රායෝගික පුහුණුව ලබන අභ්‍යාසලාභී 2023 ජනවාරි මස දීමනාව ගෙවීම - ඩබ්.ඒ.එම්.ජී. ප්‍රියශානි | 7,000.00 |
| 91 | 186 | ප්‍රායෝගික පුහුණුව ලබන අභ්‍යාසලාභී දෙසැම්බර්/ජනවාරි මස දීමනාව ගෙවීම - කේ.කේ. නෙත්මි | 15,500.00 |
| 92 | 187 | මහජන නියෝජිත ඉන්ධන දීමනාව ගෙවීම | 12,000.00 |
| 93 | 188 | 2023 ජනවාරි මස අතිකාල දීමනා ගෙවීම - එච්.එම්. සුපුන් | 1,166.00 |
| 94 | 189 | 2023 ජනවාරි මස අතිකාල දීමනා ගෙවීම - සමීර සම්පත් | 5,388.00 |
| 95 | 190 | 2022 දෙසැම්බර් මස අතිකාල දීමනා ගෙවීම - සමීර සම්පත් | 5,388.00 |
| 96 | 191 | ඇප තැන්පතු මුදල් නිදහස් කිරීම - වී.ඩී.ජේ. කොඩිතුවක්කු | 50,000.00 |
| 97 | 192 | ලිපි තැපැල් මුද්දර ගාස්තු අලුත් කිරීම | 20,000.00 |
| 98 | 193 | 2023 පෙබරවාරි මස සේවක වැටුප් ගෙවීම | 58,055.00 |
| 99 | 194 | ජල නල එලීමට මාර්ග පලුදු සඳහා ගෙවන ලද මුදල් නැවත ගෙවීම - ඩබ්.කේ. සුසන්ත කුමාර | 4,500.00 |
| 100 | 195 | කම්බි කනු සැකසීමට සිමෙන්ති කොට්ට 03 ක් ලබාගැනීම | 8,250.00 |
| 101 | 196 | ඡායා පිටපත් යන්ත්‍රය සඳහා ටෝනර ලබාගැනීම - ඇසිස්ට් ටෙක්නොලොජි | 23,850.00 |
| 102 | 197 | මාර්ග අංශය සඳහා තණකොළ කපන තල 10 ක් ලබාගැනීම - ඕෂදී ග්ලාස් සෙන්ටර් | 6,500.00 |
| 103 | 198 | රථවාහන අංගනයේ ජල ටැංකිය සවි කිරීමට උපකරණ ලබාගැනීම - ඕෂදී ග්ලාස් සෙන්ටර් | 1,750.00 |
| 104 | 199 | කොඩිගොඩැල්ල ක්‍රීඩාංගනය ඉදිරිපිට ඇතිරීමට චිප් ගල් ලබාගැනීම - වීරසේකර බිල්ඩර්ස් | 19,700.00 |
| 105 | 200 | මාර්ග අංශයේ කැති මුවහත් කිරීම - චන්ද්‍රසිරි මුණසිංහ | 3,100.00 |
| 106 | 201 | තාක්ෂණ අංශයට මීටර් 20 ටේප් එකක් ලබාගැනීම - සිට්නාමලුව හාඩ්වෙයාර් | 1,200.00 |
| 107 | 202 | ආදාහනාගාරය සඳහා පිරවූ ගෑස් සිලින්ඩර් 05 ක් ලබාගැනීම-සිට්නාමලුව හාඩ්වෙයාර් | 103,500.00 |
| 108 | 203 | කාර්යාලට සඳහා සංග්‍රහ ද්‍රව්‍ය ලබාගැනීම - චන්දිමාල් ෆෑට්සිටි | 3,905.00 |
| 109 | 204 | කාර්යාල ගබඩාව සඳහා ආකෘතිපත්‍ර මුද්‍රණය | 30,880.00 |
| 110 | 205 | 2023 පෙබරවාරි මස සභා රැස්වීම සඳහා සංග්‍රහ ද්‍රව්‍ය ලබාගැනීම - එම්.කේ.එස්.එස්. කුමාර | 32,995.00 |

***<u>සේවක ණය ගිණුම</u>***

| අ.අ | වවුචර් අංකය | කාරණය | මුදල රු. |
|---|---|---|---|
| 1 | 1 | 2023 වර්ෂය සඳහා විශේෂ අත්තිකාරම් ලබාදීම | 212,000.00 |
| 2 | 2 | ආපදා ණය මුදල ගෙවීම - ජේ.එල්.ඒ. ජයන්ත | 250,000.00 |
| 3 | 3 | 2023 වර්ෂය සඳහා විශේෂ අත්තිකාරම් ලබාදීම | 52,000.00 |

ඒ අනුව ඉහත අංක 09 (II) හි සභා ආවරණ අනුමැතිය යටතේ කළ ගෙවීම් ඇතුළු 2023 පෙබරවාරි මාසයේ ගෙවීම් කරන ලද සියළුම ගෙවීම් වාර්තා පිළිගැනිමට හා අනුමැතිය ලබා දීමට සුදුසු බව ගරු සභාපති සිරිල්

මුණසිංහ මහතා යෝජනා කරන ලදුව, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වී.පි.තිලක් කුමාර මහතා ස්ථිර කිරීමෙන් පසු ඒකමතිකව සභා සම්මත විය.

**09(III) මිළ ගණන් හා කමිටු වාර්තා පිළිගැනීම, ඇස්තමේන්තු හා වැඩ පිරිනැමීම අනුමත කිරීම.**

**09.(III) (අ) මිළ ගණන් හා මිළ කමිටු වාර්තා අනුමත කිරීම**

2022.03.10 ප්‍රසම්පාදන කමිටු තීරණ

**09.(III)(අ) I- වීථි පහන් නඩත්තුව සඳහා විදුලි බල්බ හා විදුලි උපකරණ මිල දී ගැනිම.**

2023 වර්ෂයේ මුල් කාර්තුව සඳහා මිල ප්‍රදේශයේ වීථි පහන් නඩත්තු කිරීම සඳහා අවශ්‍ය වන ද්‍රව්‍ය ලබා ගැනීම සඳහා විදුලි අංශය විසින් ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත. එම ඉල්ලීම 2023.02.21 දින මහා සභාවේ තීරණ අංක 7(I) මඟින් අනුමත වී ඇති අතර ඒ අනුව එම ද්‍රව්‍ය ලබා ගැනීම සඳහා මිල ගණන් සැපයුම්කරුවන්ගෙන් කැඳවන ලදි.

| අ.අ. | විස්තරය | කැලුම් ඉලෙක්ට්‍රිකල්ස්,තංගල්ල පාර,බෙලිඅත්ත (රු) | සිටිනාමලුව හාඩ්වෙයාර් ස්ටොර්ස්, සිටිනාමලුව,තංගල්ල (රු) | වන්නිආරච්චි ඉලෙක්ට්‍රිකල්ස්, තංගල්ල පාර, බෙලිඅත්ත (රු) |
|---|---|---|---|---|
| 01. | 12 W LED Orange | 1,550.00 | 1,450.00 | 1,250.00 |
| 02. | තම්ලා ස්විච් (10 | 360.00 | 360.00 | 330.00 |
| 03. | හෝල්ඩර් (පොලික්‍රොම්) | 290.00 | 270.00 | 250.00 |
| 04. | වයර් කොයිල් (1/1.3) | 7.400.00 | 7,000.00 | 6,800.00 |
| 05. | ඉලෙක්ට්‍රිකල්ඉන්සියුලේෂන් | 180.00 | 170.00 | 170.00 |

මෙම මිල ගණන් අතරින් අවම මිල ගණන ඉදිරිපත් කර ඇත්තේ වන්නිආරච්චි ඉලෙක්ට්‍රිකල්ස්, තංගල්ල පාර, බෙලිඅත්ත ආයතනයෙන්ය. එම ආයතනයෙන් විදුලි උපාංග මිලදී ගැනීමටත් ඒ සඳහා ගෙවීම් කිරීමටත් ප්‍රසම්පාදන කමිටුව තීරණය කරන ලදී.

**09.(III)(අ) II- සෞඛ්‍ය අංශය සඳහා සැපයුම් ද්‍රව්‍ය මිල දී ගැනීම.**

| අ.අ. | විස්තරය | සිටිනාමලුව හාඩ්වෙයාර් ස්ටෝර්ස්,සිටිනාමලුව, තංගල්ල (රු) | ජයවර්ධන ට්‍රේඩර්ස්, සිටිනාමලුව,තංගල්ල (රු) | ඉන්දික හාඩ්වෙයාර්,වලස්මුල්ල පාර,බෙලිඅත්ත (රු) |
|---|---|---|---|---|
| 01. | ක්ලෝරීන් 50kg බැරල් | 13,000.00 | 140,000.00 | 13,500.00 |
| 02. | හාපික් 50L | 1,005.00 | 1,100.00 | 1,150.00 |
| 03. | පීනෝල්50L | 155.00 | 170.00 | 160.00 |
| 04. | අත්මේස් දිග (ජෝඩු | 375.00 | 400.00 | 400.00 |
| 05. | ප්ලාස්ටික් කොසු 15 | 550.00 | 560.00 | 350.00 |
| 06. | ඉදල් 50 | 245.00 | 250.00 | 250.00 |
| 07. | තාච්චි (ප්ලාස්ටික්) 15 | 240.00 | 300.00 | 250.00 |
| 08. | උදලු (9x9) 12 (කිඹුලා) | 3,750.00 | 3,790.00 | 3,800.00 |
| 09. | සිමෙන්ති (50 kg) සංස්ථා | 2,750.00 | 2,800.00 | 2,800.00 |
| 10. | වැලි (ගඟේ වැලි) කියුබ් 1/4 | 7,100.00 | 7,300.00 | 7,500.00 |

මෙම මිල ගණන් ප්ලාස්ටික් කොසු සඳහා අඩුම මිලක් ඉදිරිපත් කර ඇත්තේ ඉන්දික හඩ්වෙයාර් වලස්මුල්ල පාර, බෙලිඅත්ත ආයතනය වන අතර අනිකුත් ද්‍රව්‍ය සඳහා අවම මිල ඉදිරිපත්කර ඇත්තේ සිටිනාමළුව, තංගල්ල ආයතනයයි. එබැවින්, ඉන්දික හාඩ්වෙයාර් වෙතින් ප්ලාස්ටික් කොසු 15 ක් සහ අනෙකුත් ද්‍රව්‍ය සිටිනාමලුව හාඩ්වෙයාර් ස්ටෝර්ස් වෙතින් ලබා ගැනීමටත් ගෙවීම් කටයුතු කිරීමටත් ප්‍රසම්පාදන කමිටුව විසින් තීරණය කරන ලදී.

**09.(III)(අ) IV - ලිපි ද්‍රව්‍ය මිළදී ගැනීම**

සභා කාර්යාලීය ගබඩාව සඳහා ලිපි ද්‍රව්‍ය ලබා ගැනීම සඳහා මිල ගණන් කැඳවන ලදුව පහත සඳහන් ආයතන මිල ගණන් ඉදිරිපත් කර ඇත.

| භාණ්ඩය /සේවාව | අවශ්‍ය ප්‍රමාණය | රජයේ වාණිජ නීතිගත සංස්ථාව මාතර | මෙට්රෝ කම්පියුටර්ස් මාතර | සී/හම්බන්තොට දිස්ත්‍රික් සමුපකාර ග්‍රාමීය බැංකු සංගමය |
|---|---|---|---|---|
| 01.නිල් කළු රතු පෑන්(ඇට්ලස් චූටි) | 400 | රු.32.00 | රු.24.00 | රු.29.00 |
| 02 නිල් කළු රතු පෑන් (ස්පීඩ් රයිඩර් මැක්ස්) | | - | - | රු.22.00 |
| 03. නිල් කළු රතු පෑන් (මැංගෝ) | | - | - | රු.23.00 |
| 04.මාකර් පෙන්(Blue/Red White Broad) (ඇට්ලස්) | 15 | රු.165.00 | රු.175.00 | රු.145.00 |
| 05.මාකර් පෙන්(පර්මනට්) (ඇට්ලස්) | 10 | රු.148.01 | රු.175.00 | රු.145.00 |
| 06.හයිලයිට් පෙන්(පාට 04කින්) (ඇට්ලස්) | 50 | - | රු.175.00 | රු.175.00 |
| 07.ක්ෂේත්‍ර සටහන් පොත්(පිටු 80) | 20 | රු.197.95 | රු.125.00 | රු.130.00 |
| 08.ටිපෙක්ස් (බෝතල) | 24 | - | රු.160.00 | රු.220.00 |
| 08.ටිපෙක්ස්(pen SML) | 24 | රු.148.02 | - | - |
| 09.ස්ටෙප්ලර් කටු පැකට් 369 | 50 | රු.90.51 | රු.75.00 | රු.80.00 |
| 10.අඩිරූල්(ඇට්ලස්) | 10 | රු.72.00 | - | රු.75.00 |
| 10.අඩිරූල් | 10 | - | රු.55.00 | - |
| 11.ඇමුණුම් කටු(පින්ස්) පෙට්ටි | 06 | රු.110.00 | රු.45.00 | රු.95.00 |
| 12.කතුරු(ලොකු) | 10 | රු.410.00 | රු.375.00 | රු.480.00 |
| 13.පෑඩ් තීන්ත බෝතල් | 06 | - | රු.125.00 | රු.300.00 |
| 14.A4 බන්ඩල් (සුදු) 80GSM Double A | 50 | රු.2050.00 | - | රු.2075.00 |
| A4 බන්ඩල් (සුදු) 80GSM HAC | 50 | - | රු.1950.00 | - |
| 15.A4 කොල බන්ඩල් (පාට) 80GSM (ලා නිල්) | 01 | - | රු.3250.00 | රු.4750.00 |
| 16.A3 කොල බන්ඩල් | 01 | රු.4600.00 | - | රු.3910.00 |
| 17.ලීගල් කොල බන්ඩල් | 02 | රු.3200.00 | - | රු.3200.00 |
| 18.හාෆ්ෂීට් බණ්ඩල් | 10 | - | රු.1750.00 | රු.1700.00 |
| 19. ගම් බෝතල්(50ml) | 50 | රු.83.00 | රු.65.00 | රු.80.00 |
| 20.බයින්ඩින් ගම් බෝතල් - 250ml | 10 | රු.380.00 | රු.450.00 | රු.250.00 |
| 21.ලිපි ගොණු කවර(කාඩ්බෝඩ්) | 500 | රු.20.50 | රු.55.00 | රු.20.00 |
| 22.ගම්ටේප්(ඇඩිසිව් ටේප්/පොත් බැඳීම සඳහා)) | 08 | රු.189.00 | රු.325.00 | රු.380.00 |
| 23.සෙලොටේප් “1” | 35 | රු.128.00 | රු.175.00 | රු.160.00 |
| 24.සෙලෝටේප් “2” 100m | 10 | - | රු.325.00 | රු.300.00 |
| සෙලෝටේප් “2” 50m | 10 | රු.250.14 | - | රු.185.00 |
| 25.ස්ටෙප්ලර් මැෂින්(HG-45) | 10 | - | රු.650.00 | රු.980.00 |
| 26.පන්චර් | 06 | - | රු.475.00 | රු.1125.00 |
| 27.ෆයිල් ක්ලිප් | 12 | රු.93.00 | රු.75.00 | රු.105.00 |
| 28.පරිගණක ෂීට්(15*11) | 02 | රු.8875.00 | - | - |
| 29.පරිගණක ෂීට්(9.5*11) | 02 | රු.6025.00 | රු.6750.00 | රු.6335.00 |
| 30.සුදු හුණු පෙට්ටි | 05 | - | රු.680.00 | රු.330.00 |
| 31.ලයිෆ්බෝයි කෑට | 150 | රු.168.86 | - | රු.148.00 |
| 32.EPSON L130 වර්ණ තීන්ත සෙට් (Original) | 01 | - | රු.11000.00 | - |
| 33.EPSON M100 තීන්ත බෝතල් (Original) | 08 | - | රු.4250.00 | - |
| 34.EPSON LQ 2180 රිබන් (Original) | 02 | රු.9775.00 | රු.6750.00 | - |
| 35.P1102(85A) ටෝනර් (Original) | 02 | - | රු.7900.00 | - |
| 36.TOSHIBA ටෝනර් - 2329A(Original) | 01 | රු.24178.75 | රු.23000.00 | - |

| | | | | |
|---|---|---|---|---|
| 37.H.P.Laserjet 225t(83A) Toner(Original) | 01 | - | රු.8250.00 | - |
| 38. EPSON LQ 310 රිබන් (Original) | 06 | - | 1900.00 | - |
| 39.BROTHER L 2700 D ටෝනර් (Original) | 01 | රු.41083.75 | 9750.00 | - |

ඉහත මිල ගණන් අතුරින් අඩිරූල්(ඇට්ලස්) A4 Double A, ගම්ටේප්,සෙලෝටේප් 1'', පරිඝණක ශීට්(15x11), (9.5x11) සඳහා අවම මිලක් ඉදිරිපත් කර ඇති සී/ස රජයේ වාණිජ(විවිධ) නීතිගත සංස්ථාව,15 දුම්රිය පොල පාර, මාතර ආයතනයෙන් එම ද්‍රව්‍ය මිල දී ගැනීමටත්, මාර්ක පෙන් පර්මනන්ට් සහ වයිට් බෝඩ්,A3කොළ, ලීගල් කොල,හාප්ශීට් බයින්ඩින් ගම් 250 ml,ලිපිගොනු කවර,සෙලෝටේප් 2'', සුදුහුණු පෙට්ටි, ලයිට්බෝයි සබන් සඳහා අවම මිලක් ඉදිරිපත් කර ඇති සී/ස හම්බන්තොට දිස්ත්‍රික් සමූපාකාර ග්‍රාමීය බැංකු සංගමය, කඳුරුපොකුණ පාර,තංගල්ල ආයතනයෙන් ලබා ගැනීමටත් ඉතිරි ද්‍රව්‍ය හා උපකරණ සඳහා අවම මිල ඉදිරිපත් කර ඇති මෙට්රෝ කම්පියුටර් ටෙක්නොලජී,02 කාලිදාස පාර,මාතර ආයතනයෙන් ලබා ගැනීමටත් ප්‍රසම්පාදන කමිටුව තීරණය කරන ලදි.

මෙම ප්‍රසම්පාදන කමිටු තීරණයන්ට අනුව මෙම භාණ්ඩ මිලදී ගැනීමටත් ඒ සඳහා ගෙවීම් කිරීමටත් විරෝධතාවයකින් තොරව ඒකමතිකව සභා සම්මත කරන ලදි.

**09.III (ආ) ඇස්තමේන්තු හා වැඩ පිරිනැමීම අනුමත කිරීම, වැඩ අවසන් ව්‍යාපෘතීන් සඳහා මුදල් ගෙවීම**

**09.III (ආ) 1 - ඇස්තමේන්තු අනුමත කිරීම -නැත.**

**09.(III)(ආ) 1- මහහීල්ල ධම්මරතන මාර්ගයේ කාණු පද්ධතිය සකස් කිරීමේ ඇස්තමේන්තුව**

මහහීල්ල ධම්මරතන මාර්ගයේ කාණු පද්ධතිය සකස් කිරීම සඳහා ඇස්තමේන්තුවක් සකස් කර ඇති අතර ඒ සඳහා රු.282,045.43 ක් මුදලක් වැය වන බව එම ඇස්තමේන්තුවේ සඳහන් වේ.

ඒ අනුව, මහහීල්ල ධම්මරතන මාර්ගයේ කාණු පද්ධතිය සකස් කිරීමටත් ඒ සඳහා වැය වන රු.282,045.43 ක මුදලක් ගෙවීමටත් විරෝධතාවයකින් තොරව ඒකමතිකව සභා සම්මත කරන ලදි.

**09..III (ආ) 2. වැඩ පිරිනැමීම අනුමත කිරීම. -නැත.**

**09.III (ආ) 3. වැඩ අවසන් ව්‍යාපෘතීන් සඳහා මුදල් ගෙවීම. –**

ගලගම දකුණ සොමි මාවත කුට්ටිගල් අතුරා සංවර්ධනය කිරීමේ කර්මාන්තයේ කොටස් මුදල් ලෙස රු.1,994,957.59 ක මුදලක් ගෙවිමට තිබෙනවා.

ඒ අනුව, ගලගම දකුණ සොමි මාවත කුට්ටිගල් අතුරා සංවර්ධනය කිරීමේ කර්මාන්තයේ කොටස් මුදල් ලෙස රු.1,994,957.59 ක මුදලක් ගෙවිමට විරෝධතාවයකින් තොරව ඒකමතිකව සභා සම්මත කරන ලදි

**10. වෙනත් කරුණු:-**

**10(I). නව නගර සැලසුමට අනුව බෙලිඅත්ත නගරයේ ඉදි කිරීම පිළිබඳ යෝජනාව**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මානවඩුගේ කැලුම් ජානක මහතා**

අද වන විට බෙලිඅත්ත නගරය සැලසුමකට අනුව නිර්මාණය නොවූ නිසා ගැටල් ගණනාවකට මුහුණ දී තිබෙනවා. නාගරික සංවර්ධන අධිකාරිය හා බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව වසර ගණනාවක් තිස්සේ පැවැති සාකච්ඡා අවසන් එකඟතාවයකට පැමිණි අතර ඉදිරියේදී නගරයේ කිසියම් ගොඩනැගිල්ලක් තැනීමේ දී මෙම සැලසුමට අනුව කටයුතු කලයුතු බව එහි දී තීරණය විය. විටින් විට පැවැති රජයන් විසින් නගරයේ සැලසුමකින් තොරව ඉදිකර ඇති රජයේ ගොඩනැගිලි ආයතන හා පොළ සම්පූර්ණයෙන්ම අසාර්ථකත්වයට පත් වි තිබෙනවා. එසේම බෙලිඅත්ත නගරය වෙළෙඳ නගරයක් බැවින් මෙම නගරයේ නිදහස් වෙළඳ කටයුතු සඳහා කිසිම ඉඩ පහසුකමක් නොමැති බව ප්‍රකාශ කළ යුතුය. එම නිසා මෙම නගරය සාර්ථක වෙළෙඳ නගරයක් බවට පත්කිරීමට අද හැකියාව ලැබී නැහැ.

විශේෂයෙන්ම බෙලිඅත්ත නගර මධ්‍යයේ පැවති රජයේ ගොඩනැඟිලි, ආයතන, පොදු වෙළඳපල, මාළු වෙළඳසැල, ප්‍රාදේශීය සභාව හා බෙලිඅත්ත පොලීසිය නගර සැලසුමට අනුව ඉදිකිරීමට අවශ්‍ය බව මා මෙහිදී යෝජනා කරනවා. ඒ අනුව ප්‍රාදේශීය සභාව හා බෙලිඅත්ත පොලීසිය පුවක්දණ්ඩාව ප්‍රදේශයට ගෙන යාමට අපි මීට පෙරත් යෝජනාවක් ගෙන ආවා. නමුත් එය ක්‍රියාත්මක වුයේ නැහැ. එම නිසා මම යෝජනා කරන්නේ ප්‍රාදේශීය සභාව හා බෙලිඅත්ත පොලීසිය පුවක්දණ්ඩාව ප්‍රදේශයට ගෙන යන ලෙසයි.

රජයේ හෝ පෞද්ගලික කිසිදු ආයතනයක වාහන නතර කිරීම සඳහා රථවාහන නැවතුම්හළක් නොමැත. නගරය පුරා නිතරම වාහන තදබදයක් ඇත. ත්‍රීරෝද රථ නතර කිරීම ස්ථානයක් නොමැත. පුද්ගලික බස් රථ සඳහා නැවතුම්පලක් නොමැත. එම නිසා මෙම නගරය විශාල ප්‍රශ්න ගණනාවකට මුහුණ දී සිටී. මුලසිටම කිසිදු සැලසුමක් නොමැතිව ක්‍රියාත්මක වූ නිසා සිදු වූ අඩුපාඩු නිසා අද වන විට බෙලිඅත්ත නගරය සම්පූර්ණයෙන්ම අසාර්ථක වෙළඳ නගරයක් බවට පත්වෙලා තිබෙනවා. එම වරද තවත් ඉදිරියට යාම වැළැක්වීම සඳහා නව නගර සැලසුමකට අනුව කටයුතු කිරීමට අනුමැතිය ලබා දිය යුතු බව මම යෝජනා කර සිටිනවා.

<u>ගරු සභාපති සිරිල් මුණසිංහ මහතා</u>

ඒ අනුව, නව නගර සැලසුමට අනුව බෙලිඅත්ත නගරයේ ඉදි කිරීම් සිදුකිරීම පිළිබඳව වූ යෝජනාව විරෝධතාවයකින් තොරව ඒකමතිකව සභා සම්මත කරන ලදි.

මෙය අපගේ අවසාන සභාවේ යැයි මා විශ්වාස කරනවා. මම වසර 33 කට ආසන්න කාලයක් මේ සභාව නියෝජනය කරමින් සභාව තුළ වැඩ කටයුතු කලා. මම මෙහි වැඩ කටයුතු සිදු කිරීමේ දී සියලු දෙනාගේම අදහස්වලට ඇහුම්කම් දෙමින් කිසිදු කෙනෙකුට අසාධාරණයක් නොවන ආකාරයට වැඩ කටයුතු සිදු කලා. එසේම වැඩකටයුතු සිදුකිරීමේදී මන්ත්‍රීවරුන් ආරක්ෂා කරමින් මේ සියලු කටයුතු සිදු කලා. මෙවර මැතිවරණය පැවැත්වුවහොත් ඊළඟට පත්වන සභාවට මං ඉන්නේ නැහැ.

මේ වසර 33 පුරාවට මා මේ ප්‍රාදේශීය සභාව තුළන් ජනතාවට සිදු කළ හැකි සේවය මම ඉටු කළා. මට මේ දක්වා සහයෝගය ලබා දුන් සියලු ජනතාවට මම මාගේ ස්තූතිය ප්‍රකාශ කර සිටිනවා. මම ලේකම්වරුන් හතර දෙනෙකු සමඟ කටයුතු කලා. ඒ සියලු දෙනා මට විශාල සහයෝගයක් ලබා දුන්නා. එසේම දැනට සිටින කාර්ය මණ්ඩලය සහ මීට පෙර සිටි කාර්ය මණ්ඩලය මට විශාල සහයෝගයක් ලබා දුන්නා. ඒ සියලු දෙනාටම මම මාගේ ස්තූතිය ප්‍රකාශ කරනවා.

ඒ අනුව අද දිනට නියමිත සභාවේ වැඩ කටයුතු අවසන්ව ඇති බැවින්, මෙම සභාවේ කටයුතු සාර්ථක කර ගැනීම සඳහා සහයෝගය ලබාදුන් ගරු මන්ත්‍රීතුමන්ලාටත්, සභාවේ ලේකම් මහතා, කාර්ය මණ්ඩලයටත්, මාධ්‍යවේදී මහත්මයන් ඇතුළු සැමට ස්තුති කරමින් සභාවේ කටයුතු අවසන් කරන ලදී.

ඒ අනුව ප.ව. 2.45 ට පමණ සභාවේ කටයුතු අවසන් කරන ලදී.

සිරිල් මුණසිංහ,
සභාපති,
බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව.